සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

45 | S | I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 13 - 2019

විභාග අංකය ............................ | බෞද්ධ ශිෂ්ටාචාරය I | කාලය පැය දෙකයි

**වැදගත්**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට 1,2,3,4,5 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එය සලකුණු කරන්න.**

01. බ්‍රාහ්මණයෝ ස්වධර්ම නිර්දේශ කර එය අනුල්ලංඝනීය පිළිවෙතක් ලෙස අවධාරණය කළ ද සජීවී සමාජයක් තුළ එවැනි අනම්‍ය ශ්‍රම විභජන රටාවක් පවත්වාගෙන යෑම දුෂ්කර බව ඔවුන්ට ම අවබෝධ වූයෙන් ස්වධර්මවලට විකල්පයක් ලෙස ඉදිරිපත් කළ පිළිවෙත නම්,
(1) වර්ණ ධර්මයි. (2) යාගයයි. (3) ආපද් ධර්මයි. (4) ආශ්‍රම ධර්මයි. (5) උපනයනයයි.

02. බ්‍රාහ්මණයන් විසින් ඉගැන්වූ ''ආශ්‍රම ධර්ම'' මගින් අදහස් කරන ලද්දේ,
(1) තාපස ජීවිතයේ දී අනුගමනය කළයුතු චාරිත්‍ර ධර්ම යන්නයි.
(2) ජීවිතයේ ඒ ඒ යුගවල ඉටු කළ යුතු වගකීම් සමුදායයි.
(3) චතුර්වර්ණ කුල ක්‍රමයයි.
(4) බ්‍රාහ්මණයන් විසින් ආපදා අවස්ථාවලදී ඉටු කළ යුතු යුතුකම් සමූහයයි.
(5) උත්පත්තියෙන් ඒ ඒ කුලවලට පැවරෙන රාජකාරි ක්‍රමයයි.

03. බමුණන් විසින් නිර්දේශිත මහා යාගයන් සිදු කිරීමට බ්‍රාහ්මණ පූජකවරුන් කිහිප දෙනෙකුගේ සහභාගිත්වය අත්‍යවශ්‍ය වූ අතර, එහිදී ඔවුන්ට වෙන වෙන ම කාර්යයන් ද පැවරුණි. ඒ අනුව **හෝතෘට** පැවරුණ කාර්යය නම්,
(1) යාග භූමිය සකස් කිරීමයි. (2) යාගයේ අධ්‍යක්ෂ ක්‍රියාවලියයි.
(3) වේද පාඨ ගායනා කිරීමයි. (4) යාගයට ආරාධනා කිරීමයි.
(5) යාගය සිදු කිරීමයි.

04. බ්‍රාහ්මණ ඉගැන්වීම්වලට අනුව ස්වාමියාගේ මරණයෙන් පසු භාර්යාව ජීවත් වන්නේ නම් ඇය වාසය කළයුත්තේ කිළිටි වස්ත්‍ර හැඳ, රසවත් ආහාරපානාදියෙන් වැළකී, කිසිදු ආභරණයක් නොපැළඳ, මිය ගිය ස්වාමියා ම පතමින් ගෘහ දාසියක ලෙස ය. මෙම චාරිත්‍රය බ්‍රාහ්මණ ධර්මයන්හි දැක්වෙන්නේ,
(1) සති පූජාව වශයෙනි. (2) ගෘහීය චාරිත්‍ර වශයෙනි. (3) උපනයන චාරිත්‍ර වශයෙනි.
(4) පර්ධා චාරිත්‍ර වශයෙනි. (5) ශ්‍රාද්ධ පූජාව වශයෙනි.

05. "නූතන විද්‍යාත්මක චින්තනයට පිළිගත හැකි ආගමක් වේ නම් ඒ බුදු දහමයි." යනුවෙන් බුදුරජාණන් වහන්සේගේ ගුණ මහිමය ඇගයීමට ලක්කරණු ලැබුවේ,
(1) ඇල්බට් අයින්ස්ටයින් ය. (2) බර්ට්‍රන්ඩ් රසල්ය. (3) මහාචාර්ය මැක්ස්මුලර්ය.
(4) මහාචාර්ය සෝන්ඩර්ස් ය. (5) එඩ්වින් ආර්නෝල්ඩ්ය.

06. අමරා වික්ෂේපවාදය ඉදිරිපත් කළ සංජය බෙල්ලට්ඨිපුත්ත ශාස්තෘවරයා කිසිදු ප්‍රශ්නයකට නිශ්චිත පිළිතුරක් ලබා නොදීමට හේතු වූ කරුණු හතරක් බුදුසමය පෙන්වා දෙයි. ඒ අතර **'' අනුයෝග භයා අනුයෝග පරිජෙගුච්ඡා''** යන්නෙන් අදහස් කරන ලද්දේ,
(1) පිළිතුර වැරදුනොත් මුසාවාදයක් වේයැයි ඇති බිය හා අකමැත්ත නිසා ය.
(2) පිළිතුරෙන් යම් උපාදානයක් වේයැයි ඇති බිය හා අකමැත්ත නිසා ය.
(3) පිළිතුරු දීමේදී යමෙකු විසින් කරනු ලබන ප්‍රශ්න විචාරීමට ඇති බිය හා අකමැත්ත නිසා ය.
(4) නුවණ මඳ බැවින් හා බෙහෙවින් ම මෝඩ නිසා ය.
(5) පිළිතුරු වාචා වික්ෂේපයක් පමණක් වන නිසා ය.

07. බුද්ධ කාලීන භාරතයේ ශ්‍රමණ චින්තනය තුළ විශාල අනුගාමිකයින් පිරිසකට නායකත්වය ලබා දෙමින් විවිධ දර්ශනවාදයන් ඉදිරිපත් කළ ෂට් ශාස්තෘවරු සියලු දෙනා ම නොපිළිගත් ආගමික මතයක් නම්,
(1) අනගාරික ප්‍රතිපදාවයි.
(2) සියලු දෙනා සදාතනික පරමාණු පදාර්ථවලින් නිර්මාණය වී ඇති බවයි.
(3) ජන්මීය සාධක මත පුද්ගලයා උසස් හෝ පහත් වන බවයි.
(4) සත්වයා හා ලෝකය ඊශ්වර නිර්මාණ වන බවයි.
(5) සියලු දෙනා නියතියකට අනුව සසර ගමන් කරන බවයි.

08. ක්‍රි.පූ. 8 වන සියවසේ පෞර රාජ්‍ය බිඳ වැටීම හා අග නගරය මාරුවීම නිසා ද ප්‍රාදේශික රජවරු විසින් කුඩා කුඩා රාජ්‍ය පිහිටුවා ගැනීම නිසා ද ජනපද සොළොසක් ඇති වූ බව ත්‍රිපිටකාගත තොරතුරුවලින් හා වෙනත් මූලාශ්‍ර තුළින් පැහැදිලි වෙයි. එම ජනපද අතර **පර්වත පහකින් වට වී පිහිටීම නිසා 'ගිරිබ්බජ' යන නමින් ප්‍රකට ජනපදයත් ගෝසිංගසාල , අම්බපාලී යන වනෝද්‍යාන පිහිටි ජනපදයත්** අයත් වරණය වන්නේ.
(1) කාසි ජනපදය හා වජ්ජි ජනපදයයි.
(2) මගධ ජනපදය හා වජ්ජි ජනපදයයි.
(3) මල්ල ජනපදය හා ගන්ධාර ජනපදයයි.
(4) අංග ජනපදය හා සූරසේන ජනපදයයි.
(5) වත්ස ජනපදය හා අවන්ති ජනපදයයි.

09. බුද්ධ කාලීන භාරතීය පාලකයන් හා බුදුරජාණන් වහන්සේ අතර බොහෝ සබඳතා පැවැති බව සූත්‍ර හා විනයානුසාරයෙන් පැහැදිලි වෙයි. උපෝසථ කර්මය අනුදැනීමත් අදත්තාදාන පාරාජිකාව පැනවීමත් බුදුරදුන් විසින් සිදුකරන ලද්දේ කුමන රජුගේ ඉල්ලීමෙන්ද?
(1) බිම්බිසාර රජතුමාගේ ඉල්ලීමෙනි.
(2) කොසොල් රජතුමාගේ ඉල්ලීමෙනි.
(3) චණ්ඩපජ්ජෝත රජතුමාගේ ඉල්ලීමෙනි.
(4) අජාසත් රජතුමාගේ ඉල්ලීමෙනි.
(5) උදේන රජතුමාගේ ඉල්ලීමෙනි.

10. බුදුරජාණන් වහන්සේ ශාස්වත හා අශාස්වත යන අන්තද්වයට නො පැමිණ සුන්දර වූ නිවනට ගිය බැවින් ද එම නිවනට යහපත් ආකාරයෙන් ගිය බැවින් ද, සුදුසු තැන, සුදුසු වචන යහපත් ව කියන බැවින් ද ප්‍රකට වන බුදුගුණය වන්නේ,
(1) අරහං බුදුගුණයයි.
(2) ලෝකවිදූ බුදුගුණයයි.
(3) අනුත්තර පුරිසදම්මසාරථී බුදුගුණයයි.
(4) භගවා බුදුගුණයයි.
(5) සුගත බුදුගුණයයි.

11. විදර්ශනා ඥානය හෙවත් ලෝකයේ ඇත්ත ඇති සැටියෙන් දක්නා නුවණ ප්‍රඥාව වන අතර එය ලෝකය හා ජීවිතය පිළිබඳ ව බුදුරජාණන් වහන්සේ සතු ව පැවැති ගැඹුරු වූ ප්‍රඥාවයි. එය වටහා ගත් පිලෝතික පරිබ්‍රාජක විසින් බුදුරදුන්ගේ ප්‍රඥාව වෙසෙසින් අගය කර ඇති බව ප්‍රකාශ වන සූත්‍රය නම්,
(1) අග්ගික්ඛන්ධෝපම සූත්‍රය
(2) චූල්ල හත්ථිපදෝම සූත්‍රය
(3) අග්ගඤ්ඤසූත්‍රය
(4) උපාලි සූත්‍රය
(5) මහා සීහනාද සූත්‍රය

12. ශාස්තෘවරයකු, ගුරුවරයකු වශයෙන් බුදුරදුන් ශ්‍රාවකශ්‍රාවිකාවන්ගේ බුද්ධි මට්ටම, මානසික ස්වභාවය, දෘෂ්ටිමය පදනම, සාමාජික පරිසරය ආදිය සැලකිල්ලට ගනිමින් විවිධ පර්යාය අනුගමනය කරමින් උපාය කෞශල්‍යයෙන් යුතු ව දහම් දෙසූ බව සම්බුද්ධ දේශනා තුළින් පැහැදිලි වෙයි. බුදුරජාණන් වහන්සේ ආලවක සූත්‍රය දේශනා කිරීමෙන් ප්‍රකට වන ප්‍රශ්න විසඳූ ක්‍රමය ඇතුළත් වරණය වන්නේ.
(1) ඒකංස ව්‍යාකරණීය
(2) ඨපනීය
(3) අට්ඨුප්පත්තික
(4) පටිපුච්ඡා ව්‍යාකරණීය
(5) විභජ්ජ ව්‍යාකරණීය

13. බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමය, පූර්වාරාමය, රාජකාරාමය වැනි සුව පහසු ආරාමවල විසීමෙන් උද්දාමයට පත් නොවූවාක් මෙන් ම රුක් මුල් වන සෙනසුන් හා ගිරි ශිඛර ආදියෙහි ද සතුටින් විසූ සේක. මෙයින් පැහැදිලි වන උන්වහන්සේගේ සුවිශේෂී ගුණය වන්නේ,
(1) යථාවාදී තථාකාරී ගුණයයි.
(2) සම්මා සම්බුද්ධ ගුණයයි.
(3) තාදී ගුණයයි.
(4) පද්මාකාර ගුණයයි.
(5) ලෝකවිදූ ගුණයයි.

14. සූකර කත ලෙනේ දී බුදු රජාණන් වහන්සේ 'දීඝනඛ' පරිබ්‍රාජකයාට දේශනා කළ 'වේදනා පරිග්ගහ සූත්‍රය අසා රහත්පලයට පැමිණි අග්‍ර ශ්‍රාවක සැරියුත් මහරහතන් වහන්සේ විසින් දේශනා කරන ලද සූත්‍රයක් ලෙස නොසලකනුයේ,
(1) දීඝ නිකායේ දසුත්තර සූත්‍රයයි. (2) මජ්ඣිම නිකායේ සම්මාදිට්ඨි සූත්‍රයයි.
(3) මජ්ඣිම නිකායේ ගුලිස්සානි සූත්‍රයයි. (4) මජ්ඣිම නිකායේ සච්ච විභංග සූත්‍රයයි.
(5) දීඝ නිකායේ මහා සතිපට්ඨාන සූත්‍රයයි.

15. දිනක් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණි ආදර්ශවත් දිවිපෙවෙතක් ගත කළ නකුල පිතු ගෘහපතිතුමා කියා සිටියේ ''ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස, ... අප දෙදෙනා මෙලොවදී මෙන් ම පරලොවදී ද එක්ව ජීවත් වීමට කැමති වෙමු. '' යනුවෙනි. එහිදී බුදුන්වහන්සේ ඔවුන්ගේ ප්‍රාර්ථනා ඉටුවීමට බලපාන සමාන ගුණ හතරක් ලෙස පෙන්වා වදාළේ,
(1) මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා ය. (2) ඡන්ද, චිත්ත, විරිය, වීමංසා ය.
(3) ඡන්ද, දෝස, භය, මෝහ ය. (4) සද්ධා, සීල, චාග, පඤ්ඤා ය.
(5) කාම, භව, දිට්ඨි, අවිජ්ජා ය.

16. බුදුරජාණන් වහන්සේ ස්ත්‍රී පුරුෂ භේදයකින් තොර ව ශාසනික ප්‍රතිලාභ උරුම කරදී සමාන අයිතිවාසිකම් ලබා දීමට ක්‍රියාකළ සේක. භික්ෂුණී හා උපාසිකා පිරිස් සඳහා අග තනතුරු ප්‍රදානය කිරීමෙන් ඒ බව ප්‍රකට වෙයි. ඒ අනුව නුවණැති භික්ෂුණීන් අතර අග්‍රස්ථානය හා ඇදහිය හැකි කතා ඇති උපාසිකාවන් අතර අග්‍රස්ථානය හිමි වූයේ,
(1) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියට හා විශාඛා උපාසිකාවට ය.
(2) සකුලා තෙරණියට හා සුප්පාවාස උපාසිකාවට ය.
(3) ඛේමා තෙරණියට හා නකුල මාතා උපාසිකාවට ය.
(4) පටාචාරා තෙරණියට හා සුජාතා උපාසිකාවට ය.
(5) උප්පලවණ්ණා තෙරණියට හා සාමාවතී උපාසිකාවට ය.

17. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ සඳහන් සමාජ සම්භවය හා විකාශය පිළිබඳ කතා පුවතට අනුව මෙලොව පහළ වූ ප්‍රථම අසද්ධර්මය ලෙස සැළකිය හැකි වන්නේ,
(1). මුසාවාදයයි. (2). සොරකමයි. (3). රාගයයි. (4). මානයයි. (5). තෘෂ්ණාවයි.

18. පුද්ගල ස්වාමිත්වය, ස්වාධීනත්වය, ස්වච්ඡන්දතාව හා වගකීම පිළිබඳ අවධානය බොහෝ ආගමික ඉගැන්වීම්වල දක්නට නොලැබෙන අතර බුදු සමයෙහි මේ සියල්ලේ වැදගත්කම අවධාරණය කරයි. බුදු සමයෙහි දැක්වෙන **වගකීම** යන්නෙහි වඩාත් නිවැරදි අදහස නම්,
(1) සචේතනික ක්‍රියාවේ වගකීම කර්තෘ වෙතට පැවරෙන බවයි.
(2) සචේතනික ක්‍රියාවේ වගකීම මෙන් ම එහි විපාකය ද තමාට නොපැවරෙන බවයි.
(3) සියලු ක්‍රියාවලට තමා වගකිව යුතු බවයි.
(4) සමාජයට යුතුකම් ඉටු කිරීම තමාගේ වගකීම බවයි.
(5) සියලු වගකීම් ඊශ්වර විසින් දරනු ලබන බවයි.

19. බෞද්ධ ජාතක කථා සාහිත්‍යයෙහි දැහැමින් රට පාලනය කරන රජකු විසින් අනුගමනය කළ යුතු පිළිවෙත් දහයක් සඳහන් වන අතර හා ඒවා දශරාජ ධර්ම නමින් ප්‍රසිද්ධ ය. එහි **අවිරෝධතා** යන්නෙන් අර්ථවත් වී ඇත්තේ,
(1) මහජනයා වෙනුවෙන් කාලය, ශ්‍රමය හා භෞතික සම්පත් කැප කිරීමයි.
(2) මහජනයා සමගත් විදේශ රජුන් සමගත් නො ගැටී සහයෝගයෙන් ක්‍රියා කිරීමයි.
(3) විරුද්ධ අදහස් මතවාද හා ක්‍රියාකාරකම් කෙරෙහි ඉවසීමෙන් කටයුතු කිරීමයි.
(4) ප්‍රජාව කෙරෙහි ක්‍රෝධයෙන් තොර ව මෛත්‍රියෙන් කටයුතු කිරීමයි.
(5) මහජනයාට හිංසා පීඩා නො කිරීමයි.

20. පාසලේ බෞද්ධ සමිතියේදී චරිත ශිෂ්‍යයාට නියමිත කතාවේදී ඔහු ප්‍රකාශ කළේ **''හොඳ - නරක ක්‍රියා තීරණය කිරීමට මිනුම් දඬු රසක් බුදු දහමෙහි පෙන්වා දී ඇති බැවින් ජීවත් වීමට හා සැපවිඳීමට තමා තුළ ඇති කැමත්ත ද, මරණයට හා දුක් විඳීමට තමා තුළ ඇති අකමැත්ත ද, විමසා බැලීමත් මෙන් ම ස්වාර්ථය හා පරාර්ථය පිණිස හේතු වන සාධුචර්යාවලට අප නැඹුරු විය යුතුයි.''** යනුවෙනි. මෙහිදී චරිත ශිෂ්‍යයා පෙන්වා දෙන හොඳ - නරක විනිශ්චය නිර්ණායකයන් දෙකක් වන්නේ,
(1) චේතනාව හා විපාකය පාදක කරගැනීමයි.
(2) සැප විපාක හා දුක් විපාක පාදක කරගැනීමයි..
(3) විඤ්ඤූපසත්ථ හා විඤ්ඤූපගරහිත බව පාදක කරගැනීමයි.
(4) අත්තූපනායික ධර්මය හා තමාට හා අනුන්ට අර්ථ සිද්ධිය පාදක කරගැනීමයි.
(5) මෙලොව පරලොව තැවීම හා මෙලොව පරලොව සතුට පාදක කරගැනීමයි.

21. ස්වභාව සෞන්දර්ය හා නිර්මාණාත්මක සෞන්දර්ය බුදුරදුන්ගේ මෙන් ම ශ්‍රාවකයින්ගේ ද ඇගයීමට ලක්වූ අවස්ථා ත්‍රිපිටක සාහිත්‍යයේ සුලභව දැකිය හැකි ය. එහෙත් "නච්ච ගීත වාදිත විසූක දස්සන " යන ශික්ෂාපදයෙන් සරාගී සෞන්දර්ය රසාස්වාදය තහනම් කොට තිබේ. එය අදාළ වන්නේ,
(1) සියලු ම බෞද්ධයින්ට ය.
(2) උපාසක උපාසිකාවන්ට ය.
(3) පෙහෙවස් සමාදන් වූවන්ට ය.
(4) කුමාර බ්‍රහ්ම චර්යාවේ හැසිරෙන අයට ය.
(5) සිව්වනක් පිරිසට ය.

22. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන සදිසා නමස්කාරයේදී බුදුරජාණන් වහන්සේ විවරණ කරනුයේ සමාජය අන්‍යෝන්‍ය සම්බන්ධතා ජාලයකින් බැඳී සිටින බවත්, සියලු සාමාජිකයන් කාරුණික ව, දයාබර ව හා සුහද සිතින් සිය යුතුකම් හා වගකීම් ඉටුකරමින් සමූපකාරී සහජීවනයකට යොමු විය යුතු බවත් ය. එම යුතුකම් අතර වැරදිවලින් වැළැක්වීම හා නොඇසූ දේ කියා දීම කවුරුන් විසින් කා හට කළ යුත්තක් ද?
(1) ස්වාමිපුරුෂයා විසින් භාර්යාවට
(2) භාර්යාව විසින් ස්වාමිපුරුෂයාට
(3) සේවකයා විසින් ස්වාමියාට
(4) ගුරුවරයා විසින් ශිෂ්‍යයන්ට
(5) පූජ්‍ය පක්ෂය විසින් ගිහියන්ට

23. ''අනුන්ගේ රළු පරළු කතාත්, අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතු ය. තමා ම කළ නොකළ දේ සෙවිය යුතු ය.'' යන අර්ථය ඇති ධම්ම පද ගාථාව ඇතුළත් වර්ණය වන්නේ,
(1) ''අත්තානං චේ පියං ජඤ්ඤා ...'' යන ගාථාවයි.
(2 ''අත්තනා'ව කතං පාපං ...'' යන ගාථාවයි.
(3) ''යෝ බාලෝ මඤ්ඤති බාල්‍යං '' යන ගාථාවයි.
(4) ''න පරේසං විලෝමානි ...'' යන ගාථාවයි.
(5) ''යෝ චේ වස්සසතං ජීවේ...'' යන ගාථාවයි.

24. බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ සිටි සමයේ දෙවි මිනිසුන් වෙනුවෙන් ඉල්ලීමක් කළ එක්තරා දෙවියෙකුගේ ආරාධනයෙන් මෙලොව පරලොව සුගතිගාමී කර ගැනීමට ඉවහල් වන මංගල කරුණු තිස් අටක් දේශනා කළහ. ඒ අතර **තිදොර මනා ව හික්මවීම, යහපත් පැවතුම් ඇති බව හා කීකරුකම** යන මංගල කරුණු තුන පිළිවෙලින් කියවෙන වර්ණය කුමක්ද?
(1) විනයෝ ච සුසික්ඛිතෝ, නිවාතෝ ච , සෝවචස්සතා
(2) විනයෝ ච සුසික්ඛිතෝ, ආරති විරති පාපා , සෝව චස්සතා
(3) ගාරවෝ ච , නිවාතෝ ච , සෝව චස්සතා
(4) විනයෝ ච සුසික්ඛිතෝ, තපෝ ච
(5) නිවාතෝ ච, සුසික්ඛිතෝ, බ්‍රහ්ම චරියා ච

25. බෞද්ධයාගේ අත්පොත, පටිපදා මාර්ගය, ධර්ම මාර්ගය යන නම්වලින් හැඳින්වෙන ධම්ම පදය සමස්ත මනුෂ්‍ය වර්ගයාගේ ජීවිතයට ආලෝකය සපයන උපදේශ සංග්‍රහයකි. බුදු රජාණන් වහන්සේ විසින් ඒ ඒ අවස්ථාවන්හි දී ඒ ඒ කරුණු නිමිති කොට ගෙන දේශනා කරන ලද ගාථා මෙහි කොපමණ ඇතුළත් වේද?
(1) 510යි. (2) 423යි. (3) 310යි. (4) 426යි. (5) 308යි.

26. බුදුරජාණන් වහන්සේ විසින් හා උන් වහන්සේගේ අනුගාමිකයන් විසින් සිදු කරන ලද ධර්මදූත සේවාව යන බුද්ධ කාලීන ධර්මදූත සේවාව ප්‍රධාන ආකාර දෙකකින් සිදුවිය. ඒ අතර දෝණවත්තු ප්‍රදේශයට වැඩම කොට ඥාති වර්ගයා ඇතුළු ප්‍රදේශවාසීන් සසුන් ගත කිරීමට කටයුතු කළ මහරහතන් වහන්සේ වන්නේ,
(1) අස්සජි මහරහතන් වහන්සේ ය.
(2) මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ය.
(3) පුණ්ණමන්තානි පුත්ත මහරහතන් වහන්සේ ය.
(4) මහා කච්චායන මහරහතන් වහන්සේ ය.
(5) කොණ්ඩඤ්ඤ මහරහතන් වහන්සේ ය.

27. ශාසනයේ අභිවෘද්ධිය අපේක්ෂාවෙන් මහතෙරවරුන් රැස් වී බුද්ධ වචනය පිළිබඳ සාකච්ඡා කිරීම හා අවශ්‍ය තීරණවලට එළඹීම බෞද්ධ ධර්ම සංගායනාවෙන් සිදුවෙන අතර ප්‍රථම ධර්ම සංගීතිය පිළිබඳ තොරතුරු ඇතුළත් වඩාත් ම පැරණි පාලි මූලාශ්‍රය නම්,
(1) චුල්ල වග්ග පාලියේ සත්තසතිකක්ඛන්ධකයයි.
(2) දීපවංශයයි.
(3) චුල්ල වග්ග පාලියේ පංචසතිකක්ඛන්ධකයයි.
(4) මහා වංශයයි.
(5) සමන්තපාසාදිකාවයි.

28. සම්පත් කළමනාකරණය මෙන්ම සංරක්ෂණය පිළිබඳවත් වැදගත් උපදේශයක් අංගුත්තර නිකායේ කුල සූත්‍රයේ දැක්වේ. එහි සඳහන් කරුණුවලට අමතරව දක්වා ඇත්තේ මෙයින් කුමක් ද?
(1) දිරායන දේ ප්‍රතිසංස්කරණය කිරීම.
(2) නැසුණු සම්පත් යළි සම්පාදනය කරගැනීම.
(3) පමණ දැන පරිභෝග කිරීම.
(4) විමසීමෙන් උපාය මාර්ග සොයාගෙන ක්‍රියා කිරීම.
(5) සිල්වත් අයෙකු නිවෙසෙහි ප්‍රධානත්වයෙහි තැබීම.

29. පහත දැක්වෙන වරණ අතුරෙන් දෙවන සංගායනාවට අදාළ වරණය තෝරන්න.
   (1) විශාලා මහනුවර,වාලුකාරාමය, කාකණ්ඩපුත්ත යස මහරහතන් වහන්සේ , කාලාශෝක රජු,මාස අටයි.
   (2) විශාලා මහනුවර, අශෝකාරාමය, සබ්බකාමී මහරහතන් වහන්සේ , ධර්මාශෝක රජු, මාස නවයයි.
   (3) පැළලුප්නුවර, අශෝකාරාමය, මොග්ගලී පුත්තතිස්ස හිමි. අශෝක රජු, මාස නවයයි.
   (4) රජගහ නුවර, සප්තපණ්ණී ගුහාව, මහාකාශ්‍යප මහරහතන් වහන්සේ, අජාසත් රජතුමා, මාස හතයි.
   (5) පැළලුප්නුවර, අශෝකාරාමය, මොග්ගලී පුත්තතිස්ස හිමි. කාළාශෝක රජු, මාස හයයි.

30. ධර්මාශෝක රජු විසින් ධර්ම මහාමාත්‍යවරුන් පිටත් කර හරිනු ලැබූ ප්‍රදේශ පිළිබඳ ව සඳහන් කර ඇති ගිරි ලිපිය වන්නේ.
   (1) 07වන ගිරි ලිපියයි. (2) 13වන ගිරි ලිපියයි. (3) 03වන ගිරි ලිපියයි.
   (4) 08 වන ගිරි ලිපියයි. (5) 11 වන ගිරි ලිපියයි.

31. ''ද්විතීය ධර්මාශෝක'' යන නමින් හැඳින්වෙන කුශාන වංශ පරම්පරාවෙන් පැවත එන කණිෂ්ක රජු අධිරාජයා බවට පත්වීමෙන් පසු කාශ්මීර, යාර්ඛාන්ඩ්, ඛෝටාන්, චීන තුර්කිස්ථාන් යන භාරතයෙන් පිට ප්‍රදේශ ද ආක්‍රමණය කර වසර හතළිස් දෙකක් පාලනය කළහ. වර්තමානයේ කාශ්මීරයේ පවතින එතුමා විසින් ඉදිකළ මහා සෑයේ තඹපත්වල ලියා ශෛලමය මංජුසාවක බහා නිධන් කරන ලද ග්‍රන්ථ නම්,
   (1) පට්ඨාන ප්‍රකරණය හා උපදේශ ශාස්ත්‍ර ය. (2) විනය විභාෂා හා මහාවග්ග පාලි ය.
   (3) කථාවත්ථුප්පකරණය හා චුල්ලවග්ගපාලි ය. (4) උපදේශ ශාස්ත්‍ර හා විනය විභාෂා ය.
   (5) පට්ඨාන ප්‍රකරණය හා මහාවග්ග පාලි ය.

32. භාරතයේ පැවැති ඉපැරණි විශ්ව විද්‍යාලයක් වූ නාලන්දාවේ ක්‍රියාත්මක වූ විෂය නිර්දේශය ක්ෂේත්‍ර ගණනාවක් නියෝජනය වන ආකාරයෙන් සකස්වූවකි. එහි ක්‍රියත්මක වූ වේද මන්ත්‍ර, ජ්‍යොතිෂය, ආයුර්වේදය, සර්ප විද්‍යාව යන විෂයන් ඇතුළත් වන්නේ,
   (1) භාෂා අධ්‍යයන විෂය ධාරාවට ය. (2) ලෞකික විෂය අධ්‍යයන විෂය ධාරාවට ය.
   (3) දර්ශන අධ්‍යයන විෂය ධාරාවට ය. (4) බුද්ධ ධර්මය අධ්‍යයන විෂය ධාරාවට ය.
   (5) ලලිත කලා අධ්‍යයන විෂය ධාරාවට ය.

33. මහින්දාගමනයට පෙරාතුව මෙරට ජනසමූහයා විවිධ ආගම්, ඇදහිලි හා විශ්වාසයන් ට අදාළ ව වැඳුම් පිදුම් කිරීමට යොමු ව සිටිබව වාර්තා වේ. ඒ අතර දේව වන්දනය ද ප්‍රධාන ඇදහිල්ලක් ව පැවැතුණි. එකල වන්දනයට පාත්‍ර වූ දෙවියන් රැසක් පිළිබඳ තොරතුරු වංශකථා සාහිත්‍යයේ දැක්වේ. එම දෙවිවරුන් අතර මුළු ලක්දිවටම අධිපති දෙවියන් ලෙස සලකා වන්දනා කරන ලද්දේ,
   (1) සුමන සමන් දෙවියන්ට ය. (2) වෛශ්‍රවණ දෙවියන්ට ය (3) උපුල්වන් දෙවියන්ට ය.
   (4) ව්‍යාධ දෙවියන්ට ය. (5) පුරදේව දෙවියන්ට ය.

34. පුද්ගලයාගේ උපතේ සිට මරණය දක්වා වූ කාලපරාසය තුළ ආගම දහමට අනුකූල ව බොහෝ සමාජ ධර්ම හෙළ සංස්කෘතියට ඇතුළත්විය. දානය නම් වූ පුණ්‍ය ක්‍රියාවද එසේ ඇතුළත් වූවකි. දානය විවිධ අරමුණු පදනම් කරගෙන සිදුකෙරේ. ඒ අනුව මියගිය ඥාතිවරයාට පින් පැමිණවීමේ අරමුණින් සිදුකරන දානය හඳුන්වනුයේ,
   (1) ප්‍රාප්ති දානය වශයෙනි. (2) ධර්ම දානය වශයෙනි (3) පත්තානුමෝදනා වශයෙනි.
   (4) අභය දානය වශයෙනි. (5) ආමිස දානය වශයෙනි.

35. ලක්දිව බුදුසමය ස්ථාපිත වීමෙන් අනතුරුව ප්‍රථමයෙන්ම ආරම්භ වූ මහා විහාරයට අභියෝගාත්මක ව ගොඩනැගුණු අභයගිරි විහාරය පසුකාලීන ව ජනතාව අතර ප්‍රචලිත වීම උදෙසා ගත්තා වූ විවිධ ක්‍රියා මාර්ග අතර එක් ක්‍රියාමාර්ගයක් වූයේ
   (1) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරිම
   (2) අටුවා ග්‍රන්ථ සම්පාදනය කිරීම
   (3) ත්‍රිපිටකය මුඛ පරම්පරාගතව පවත්වා ගෙන යෑම
   (4) ථෙරවාදී බුදු දහමට පටහැනි මතවාද බැහැර කිරීම
   (5) ජනප්‍රිය පුදපූජා උත්සව සංවිධානය කිරීම

36. ථෙරවාදී බුදු සමයට අභියෝගාත්මක ව විවිධ මතවාදයන් අභයගිරිය හරහා මෙරටට පැමිණි අවස්ථාවන් ගණනාවක් ශාසන ඉතිහාසයේ දැක්වේ. වෛතුල්‍යවාදය එසේ පැමිණි මතවාදයකි. මහාවිහාරයේ මැදිහත්වීම මත හෙළ රජවරු බොහෝ විට ඒවායේ ව්‍යාප්තිය වළක්වා ගැනීමට කටයුතු කළහ. එසේ වෛතුල්‍යවාදය රැගෙන මෙරටට පැමිණි භික්ෂූන් හැට දෙනෙකුට දඬුවම් දී පළවා හැරි පාලකයා වූයේ,
   (1) මහසෙන් රජතුමා ය. (2) වෝහාරිකතිස්ස රජතුමා ය. (3) වළගම්බා රජතුමා ය.
   (4) ගෝඨාභය රජතුමා ය. (5) භාතිකාභය රජතුමා ය.

37. දුටුගැමුණු රජු භික්ෂූන් වහන්සේ කෙරෙහි අධික ප්‍රසාදයෙන් හා ගෞරවයෙන් ක්‍රියාකළ බෞද්ධ නරපතියෙකි. ඒ බව වඩාත් හොඳින් සනාථ කරන ඔහුගේ ක්‍රියාකාරකමක් වනුයේ,
(1) භික්ෂූන් වහන්සේලාට අටසැට ලෙන් ඉදිකර පූජා කිරීම යි.
(2) යුද්ධයට යාමේ දී භික්ෂූන් වහන්සේලා පෙරටුව ගමන් කිරීම යි.
(3) සම්බුදු සසුන ආරක්ෂාකිරීම සඳහා එළාර නම් ද්‍රවිඩ පාලකයා යුද්ධමය වශයෙන් පරාජය කිරීම යි.
(4) කඨින පූජාව, අරියවංශ පූජාව, වෙසක් උත්සවය ආදිය පැවැත්වීමෙන් සංස්කෘතිය පෝෂණය කිරීම යි.
(5) රජතුමා ආහාරපාන ගැනීමට ප්‍රථම දෛනික ව ආහාරපානවලින් කොටසක් භික්ෂූන් වහන්සේලාට පූජාකිරීමයි.

38. මහා විහාරයට මෙන් ම අභයගිරි විහාරයේ සංවර්ධනය සඳහා ද වරින්වර විවිධ පාලකයන් විවිධාකරයෙන් අනුග්‍රහ ලබාදී ඇත. ඒ අනුව කනිට්ඨතිස්ස රජතුමා විසින් අභයගිරි විහාරය සඳහා කරවන ලද්දක් නම්,
(1) ගාමිණීතිස්ස ජලාශය ඉදිකරදීම.
(2) රත්නප්‍රාසාද මන්දිරය කරවීම.
(3) බෝධිඝරය පිහිටුවීම.
(4) අභයගිරි විහාරය විශාලකොට ඉදිකිරීම.
(5) අෂ්ට මූලායතන පිහිටුවීම.

39. බුදු දහම ලැබීමත් සමග මෙරට රාජ්‍යය පාලකයින්ගේ උපදේශකත්වය හිමි වූයේ බෞද්ධ භික්ෂූන් වහන්සේටය. ඒ අනුව සද්ධාතිස්ස රජතුමන්ගේ උපදේශකත්වයට පත් භික්ෂූන් වහන්සේ වනුයේ
(1) කුපික්කල මහාතිස්ස හිමියන්ය.
(2) ගෝධගත්තතිස්ස හිමියන්ය
(3) කාලබුද්ධ රක්ඛිත හිමියන්ය.
(4) කොහොන් තිස්ස හිමියන්ය.
(5) බහල මස්සුතිස්ස හිමියන්ය.

40. නිර්මල ථෙරවාදී බුදු දහම ක්‍රියාත්මක රටවල් අතර ථායිලන්තයට ද ප්‍රමුඛත්වයක් හිමි වේ. එරට භික්ෂු සංස්ථාවේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරනු ලබන්නේ සංඝරාජයන් වහන්සේ ය. එරට රජතුමාට හා සමාන බලයක් උන්වහන්සේට හිමි වී ඇත. එබඳු බලයක් සහිත සංඝරාජයාණන් වහන්සේ පත්කරනු ලබන්නේ,
(1) ථායිලන්තයේ ජනතාව විසිනි
(2) ථායි භික්ෂූන් වහන්සේලා විසිනි
(3) සංඝ මන්ත්‍රී මණ්ඩලය විසිනි
(4) උත්තරීතර සංඝ සභාව විසිනි
(5) ථායිලන්තයේ රජතුමා විසිනි

41. චීනයේ මාධ්‍යමික සම්ප්‍රදායේ ගුරුවරයා ලෙස සැලකෙනුයේ කුමාරජීව පඬිවරයා ය. එතුමාගේ සංස්කෘත හා චීන භාෂාව පිළිබඳ හසල දැනුම එරට බුදු දහමේ ව්‍යාප්තිය සඳහා මහඟු පිටුවහලක් විය. එතුමන් විසින් විශාල ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කළ අතර ඇතැම් ඒවා චීන බසට පරිවර්තනය කොට ඇත. එසේ පරිවර්තනය කළ කෘතීන් අතර සුවිශේෂී කෘතියක් වන්නේ
(1) අභිධර්මකෝෂ ව්‍යාඛ්‍යා ශාස්ත්‍රය
(2) අෂ්ඨාදශ සූන්‍යතා ශාස්ත්‍රය
(3) සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
(4) සන්ධි නිර්මෝචන සූත්‍රය
(5) මහා රත්නකූට සූත්‍රය

42. සඳකඩ පහණ හෙළ කලාකරුවාගේ කලා කෞශල්‍ය ප්‍රකට කෙරෙන සුවිශේෂී නිර්මාණයකි. විශේෂයෙන් එහි අන්තර්ගත කැටයම් මෙම නිර්මාණයේ සුවිශේෂත්වය ප්‍රකට කිරීමට සමත් වී ඇත. බොහෝ විද්වතුන්ගේ මතය වන්නේ මෙම කැටයම් තුළින් කිසියම් දාර්ශනික අදහසක් පිළිබිඹු කෙරෙන බවයි. මේ පිළිබඳ ව උගතුන් විවිධ මත පළකර ඇත. ඒ අනුව මහාචාර්ය විනී විතාරන ශූරීන්ගේ මතය වන්නේ
(1) නිර්වාණය සංකේතවත් කෙරෙන බව ය.
(2) පාරිශුද්ධත්වය නිරූපණය කෙරෙන බව ය.
(3) සිව් දිසාවෙන් පැමිණෙන අයට විවෘත වූ ස්ථානයක් බව ය.
(4) සෞභාග්‍යය සංකේතවත් කෙරෙන බව ය.
(5) සංසාර චක්‍රය නිරූපණය වන බව ය

43. බුරුමයේ සිට ත්‍රිපිටක දහම හැදෑරීමට මෙරටට පැමිණි ඡප්පට හිමියන් දස වසරකට අධික කාලයක් මහා විහාරයේ රැඳීසිටිමින් ත්‍රිපිටක දහම මැනවින් හදාරා නැවත බුරුමයට වැඩම කළ බව වාර්තා වේ. එසේ වැඩම කිරීමෙන් පසු ඡප්පට හිමි බිහිකළ නිකාය වන්නේ,
(1) සීහල සංඝ නිකායයි.
(2) සියම් නිකායයි.
(3) ධම්ම යුත්තික නිකාය
(4) රාමඤ්ඤ නිකායයි.
(5) මරම්ම නිකායයි.

44 ජපානයේ බෞද්ධාගමික ඉතිහාසය විකාශය වන්නේ, එරට පැවැති රාජධානි යුග පදනම් කරගෙන ය. ඒ අනුව ජපානයට සෙන් බුදු දහම ලැබෙන්නේ කිනම් රාජධානි යුගයේදී ද?
(1) නරා යුගයේදී ය.
(2) හෙයියන් යුගයේදී ය.
(3) මෙයිජි යුගයේදී ය.
(4) කමකුරා යුගයේදී ය.
(5) ෂෝතෝකු තයිෂි යුගයේදී ය.

45. ස්තූපය වටා ගෘහයක් තැනීම් වශයෙන් ආරම්භ වූ ගෘහනිර්මාණ විශේෂයක් භාරතයේ දී චෛත්‍යශාලා නමින් හැඳින්විණි. මෙහි ආභාසය ලැබූ ශ්‍රී ලාංකික කලා ශිල්පීන් ද දේශීය අනන්‍යත්වය ද රැකගනිමින් ස්තූප ගෘහය නිර්මාණය කර ඇත. එම කලා නිර්මාණය හඳුන්වන්නේ
(1) වටදාගෙය යනුවෙනි. (2) අටදාගෙය යනුවෙනි. (3) හැටදාගෙය යනුවෙනි.
(4) ගෙඩිගේ යනුවෙනි. (5) පාසාද යනුවෙනි.

46. දෙවන පැතිස් රජුගේ සොහොයුරු උත්තිය රජු විසින් මිහිඳු හිමියන්ගේ භෂ්මාවශේෂ තැන්පත් කොට ඉදිකළ චෛත්‍යයකි.
(1) අම්භස්ථල චේතිය (2) ලංකාරාම චේතිය (3) සේල චේතිය
(4) කණ්ඨක චේතිය (5) මිරිසවැටි චේතිය

47. බුදුරජාණන් වහන්සේගේ නව අරහාදී බුදුගුණ මුල්කරගෙන සිංහල සාහිත්‍ය ග්‍රන්ථ රැසක් බිහිවිය. ඒ අතර අරහං බුදුගුණය මුල්කරගෙන බිහි වූ පැරණි සිංහල බණකතා සාහිත්‍ය ග්‍රන්ථය නම්
(1) බුත්සරණයි (2) අමාවතුරයි (3) සද්ධර්ම රත්නාවලියයි
(4) පූජාවලියයි (5) බුදුගුණාලංකාරයයි

48. ක්‍රි.පූ. පළමු සියවසේ හෝ ක්‍රි.ව. පළමු සියවසේ දී පමණ බුදුරදුන් මානව රූපීව නිර්මාණය කිරීමට කලාකරුවන් පෙලඹී ඇතිබව පිළිගැනේ. ගන්ධාර හා මථුරා සම්ප්‍රදායන් මේ සඳහා උනන්දු වී ඇත. මථුරා සම්ප්‍රදායේ බුද්ධ ප්‍රතිමාවලට සාපේක්ෂ ව ගන්ධාර ප්‍රතිමාවල දක්නට ලැබෙන සුවිශේෂී වෙනස් කමක් වන්නේ,
(1) තොල් මහත්ව තිබීම (2) දෙනෙත් අඩවන්ව තිබීම
(3) පිම්බුණු කම්මුල් සහිත වීම (4) හිසකේ කැරලි ගැසී තිබීම
(5) විනිවිද පෙනෙන තරම් දුහුල් සිවුරකින් යුක්ත වීම

49. බුද්ධ චරිතය බෝසත් සිරිත හා ශාසන ඉතිහාසය පිළිබඳ පොතපතින් ලබාදෙන දැනුමට නොදෙවෙනි දැනුමක් චිත්‍රකලාව මගින් ලබාදීමට හෙළ කලාකරුවන් උත්සුක වී ඇත. අනුරාධපුර යුගයේ පටන් නූතන යුගය දක්වා ඇති සිතුවම් එයට නිදසුන් සපයයි. ඒ අනුව නූතන යුගයට අයත් බොරැල්ලේ ගෝතමී විහාරයේ සිතුවම් අඳින ලද චිත්‍ර ශිල්පියා වන්නේ,
(1) ඇම්. සාර්ලිස් මහතා ය. (2) සෝලියස් මෙන්දිස් මහතා ය.
(3) රිචඩ් නික්සන් මහතා ය. (4) ජෝර්ජ් කීට් මහතා ය.
(5) සෝමබන්දු විද්‍යාපති මහතා ය.

50. කලාකෙත පෝෂණය කිරීමට දායක වූ අපේ නිර්මාණකරුවන් බුද්ධ චරිතය මෙන් ම ජාතක කථාවන් ද පදනම් කරගෙන ස්වකීය නිර්මාණයන් කිරීමට පෙලඹුණි. විසි වන සියවසේ බිහි වූ මහා නාට්‍ය වේදියාණන් වශයෙන් ලෙස සැලකෙන මහාචාර්ය සරච්චන්ද්‍රයන් තම නාට්‍ය නිර්මාණ සඳහා ජාතක කථා යොදාගෙන ඇත. එතුමන් විසින් ස්වර්ණහංස ජාතකය මුල්කරගෙන නිෂ්පාදනය කළ නාට්‍ය වූයේ
(1) ලෝමහංස (2) බවකඩතුරාව (3) පේමතෝ ජායතී සෝකෝ
(4) කදාවළලු (5) කාළගෝළ

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 45 | S | II |
|---|---|---|

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**Third Term Test - Grade 13 - 2019**

විභාග අංකය .............................

බෞද්ධ ශිෂ්ටාචාරය II

කාලය පැය තුනයි
අමතර කියවීම් කාලය මිනි. 10 යි.

- **අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**
- **I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

## <u>I කොටස</u>

**(මෙම කොටසින් ප්‍රශ්න දෙකක් පමණක් තෝරාගෙන පිළිතුරු සපයන්න.)**

1). i. බ්‍රාහ්මණ ඉගැන්වීම් තුළින් ශුද්‍රයාගේ සාමාජික නිදහස අහිමි වූ අයුරු නිදසුන් දෙකක් මගින් පෙන්වා දෙන්න.
ii. ක්ෂත්‍රිය වර්ණයේ ප්‍රභවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම ඉදිරිපත් කරන්න.
iii. උපාසිකාවක් වශයෙන් කාන්තාවට බුදුරදුන් උරුම කරදුන් සමාජ තත්වය අගයන්න.
iv. පකුධකච්චායන ශාස්තෘවරයාගේ ඉගැන්වීම් බුදුදහමින් නිෂේධනය වන ආකාරය පහදන්න.
v. බුද්ධ කාලීන සමාජයේ දියුණු වෙළඳ ආර්ථිකයක් පැවැති බවට තොරතුරු නිදසුන් මගින් පැහැදිලි කරන්න.

2. i බුදුරදුන්ගේ විජ්ජාචරණ ගුණයට ඇතුළත් අෂ්ට විද්‍යාවන් නම් කරන්න.
ii බහු ආගමික සමාජයක සංහිඳියාව උදාකිරීමට බුද්ධ චරිතයෙන් ගතහැකි ආදර්ශ දෙකක් නිදසුන් මගින් පහදන්න.
iii සම්බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය උදෙසා ආනන්ද හිමියන්ගෙන් සිදු වූ සේවාව අගයන්න.
iv ආරක්ඛ සම්පදාව මූලාශ්‍රයානුසාරයෙන් පහදන්න.
v හොඳ - නරක විනශ්චයට අදාළ නිර්ණායක හතරක් ඉදිරිපත් කරන්න.

3. i "මධුවා මඤ්ඤති බාලෝ ----" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කොට තේරුම ලියන්න.
ii මංගල සූත්‍රයේ දක්වෙන මංගල කරුණු අටක් නම් කරන්න.
iii දූ කෙළියෙහි ආදීනව සූත්‍රානුසාරයෙන් දක්වන්න.
iv දේවානම් පියතිස්ස රජතුමාගේ ශාසනික සේවාවන් පෙන්වා දෙන්න.
v මහින්දාගමනයට පෙරාතුව මෙරට යක්ෂ - යක්ෂිණී ඇදහිල්ල ද ජනප්‍රිය වී පැවැති බවට නිදසුන් මගින් පහදන්න.

## ii කොටස

4. i භාරතයේ පැවැති වික්‍රමශිලා විශ්වවිද්‍යාලයේ පාලන හා අධ්‍යාපන ක්‍රියාවලිය විමසීමට ලක්කරන්න.
   ii සම්බුද්ධ ශාසනයේ උන්නතිය උදෙසා කණිෂ්ක අධිරාජයාණන්ගෙන් සිදු වූ මෙහෙය අගයන්න.

5. i ජනතාවාදී රාජ්‍ය පාලනයක් බිහිකරගැනීමට බෞද්ධ දේශපාලන ඉගැන්වීම්වල පවත්නා සර්වකාලීන වැදගත්කම ගෙනහැර දක්වන්න.
   ii සෞන්දර්ය රසවිදීම පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පුද්ගලයාගේ ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා උපයෝගී කරගත හැකි ආකාරය විමර්ශනය කරන්න.

6. i ශාසන චිරස්ථිතිය විෂයෙහි භාරතයේ පැවැති ථෙරවාදී සංගායනාවලින් සිදු වූ මෙහෙය ප්‍රමාණ කරන්න.
   ii මහාවිහාරීය භික්ෂූන් වහන්සේලාගෙන් ඉටු වූ ආගමික හා ජාතික මෙහෙවර අගයන්න.

7. i බෞද්ධ ඉගැන්වීම් මගින් ශ්‍රමය මෙන් ම ශ්‍රමිකයා ද ඇගයීමට ලක්ව ඇති අයුරු පිරික්සන්න.
   ii ථායිලන්ත ජන සංස්කෘතිය බුදුදහමින් පෝෂණය වී ඇති ආකාරය පරීක්‍ෂා කරන්න.

8. i ලාංකේය බෞද්ධ ගීත සාහිත්‍යය කෙරෙහි මෙන් ම ජනකවිය කෙරෙහි ද බුදුදහමේ ආභාසය ලැබී ඇති අයුරු නිදසුන් මගින් පැහැදිළි කරන්න.
   ii බෞද්ධ ස්තූපයේ ප්‍රභවය දක්වා එහි පවත්නා ආගමික හා සංස්කෘතික වටිනාකම විමර්ශනය කරන්න.

**තෙවන වාර පරීක්ෂණය 2019 - 13 ශ්‍රේණිය - බෞද්ධ ශිෂ්ටාචාරය - පිළිතුරු**

**I පත්‍රය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 1 | 3 | 26 | 5 |
| 2 | 2 | 27 | 3 |
| 3 | 4 | 28 | 4 |
| 4 | 4 | 29 | 1 |
| 5 | 1 | 30 | 2 |
| 6 | 3 | 31 | 4 |
| 7 | 4 | 32 | 2 |
| 8 | 2 | 33 | 3 |
| 9 | 1 | 34 | 1 |
| 10 | 5 | 35 | 5 |
| 11 | 2 | 36 | 4 |
| 12 | 1 | 37 | 5 |
| 13 | 3 | 38 | 2 |
| 14 | 5 | 39 | 3 |
| 15 | 4 | 40 | 5 |
| 16 | 3 | 41 | 3 |
| 17 | 5 | 42 | 4 |
| 18 | 1 | 43 | 1 |
| 19 | 2 | 44 | 4 |
| 20 | 4 | 45 | 1 |
| 21 | 3 | 46 | 1 |
| 22 | 5 | 47 | 4 |
| 23 | 4 | 48 | 2 |
| 24 | 1 | 49 | 4 |
| 25 | 2 | 50 | 2 |

**II පත්‍රය i කොටස**

1. i. බ්‍රාහ්මණ ඉගැන්වීම් තුළින් ශුද්‍රයාගේ සාමාජික නිදහස අහිමි වූ අයුරු නිදසුන් දෙකක් මගින් පෙන්වා දෙන්න.
- ශුද්‍රයාට ස්වාධීනව කටයුතු කිරීමට ඉඩ නොලැබීම
- කුලීන වර්ණයන්ගේ දාසයකු ලෙස මරණය දක්වා කටයුතු කිරීමට සිදුවීම, බැලමෙහෙවර කිරීම
- ශුද්‍රයෙකු මැරීම සුනඛයෙකු, මැඩියෙකු, කපුටෙකු මැරීමට වඩා යමක් නොමැති බැවින් ඔවුහු සත්ව ජීවිතවලට සමාන කිරීම
- වේද අධ්‍යයනය, යාගකිරීම, ධනය ඉපැයීම, වැනි කිසිදු කටයුත්තකට සම්බන්ධවීමට නොහැකි වීම

ii. ක්ෂත්‍රිය වර්ණයේ ප්‍රභවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම ඉදිරිපත් කරන්න.
- දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ දැක්වෙන ආකාරයට ක්ෂත්‍රිය වර්ණයේ ආරම්භය සිදු වූ ආකාරය විස්තර විය යුතු ය.
- කෙත්වලට අධිපති වූ නිසා ක්ෂත්‍රිය නම් වූ බව
- මහජනතාවගේ කැමැත්තෙන් පත් වූ නිසා මහා සම්මත නම් වූ බව
- ධර්මයෙන් ජනතාව රංජනය කළ නිසා රජු නම් වූ බව
- රජුට අසීමිත බලතල ලබා නොදුන් බව

iii. උපාසිකාවක් වශයෙන් කාන්තාවට බුදුරදුන් උරුම කරදුන් සමාජ තත්වය අගයන්න.
- අනේක විධ දුක්ගැහැට විඳි කාන්තාවනට ගෘහ සමාජය තුළ ශාසනික ප්‍රතිලාභය උරුම වූයේ උපාසිකාවක් බවට පත් වීමෙන් අනතුරුවයි.
- ශාසනික වශයෙන් මාර්ගඵල ලබා සසර ගමන කෙටිකර ගැනීමට අවස්ථාව උදාවීම
- ශාසනික වශයෙන් විවිධ තනතුරු ලබා ගැනීමට අවස්ථාව උදාවීම

- ගෞරවාන්විත සමාජ පරිසරයක් උරුම වීම
- සසුන විෂයෙහි විවිධාකාර පූජාවන් සිදු කිරීමට අවස්ථාව උදාවීම

iv. පකුධකච්චායන ශාස්තෘවරයාගේ ඉගැන්වීම් බුදුදහමින් නිෂේධනය වන ආකාරය පහදන්න.

- සත්ත්වයාගේ කෙලෙසීම හා පිරිසිදු වීම හේතු ප්‍රත්‍යය රහිත ව සිදු වේ යයි මක්ඛලි ගෝසාල ප්‍රකාශ කළ ද බුදු රජාණන් වහන්සේ සංයුක්ත නිකායේ මහාලි සූත්‍රයේ දී ''අතථි මහාලි හේතු අත්ථි පච්චයෝ සත්තානං සංකිලේසාය, සහේතු සප්පච්චයා සත්තා සංකිලිස්සන්ති ආදි වශයෙන් සත්ත්වයාගේ කෙලෙසීමට හා පිරිසිදු වීමට බලපාන කරුණු පැහැදිලි ව දක්වා ඇති බව.
- අහේතු අප්‍රත්‍යයවාදය හෙවත් අධිච්චසමුප්පන්නවාදය මෙන් ම සියලු ආකාරයේ නියතිවාදී ඉගැන්වීම් ප්‍රතික්ෂේප කරමින් ''ඉමස්මිං සති ඉදං හෝති ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති ..... ''යනාදී පටිච්චසමුප්පාද සිද්ධාන්තය ඉදිරිපත් කරමින් ලොක්යෙ සියල්ල හෙත්පත්‍රාය සහිතව, පටිච්චසමුප්පන්න ව ඇති වන නැති වන අයුරු විද්‍යාත්මක ව තහවුරු කොට ඇති බව.
- ඊශ්වර නිර්මාණවාදය, පුබ්බේකතහේතුවාදය, අහේතු අප්‍රත්‍යවාදය වැනි සියලු ආකාරයේ පාරභෞතික සංකල්ප බැහැර කරන බුදුසමය ස්වච්ඡන්දතාව අනුව හොඳ - නරක මැනවින් තෝරා බේරාගෙන නිදහසේ ක්‍රියා කිරීමට ඇති හැකියාව අවධාරණය කරමින් සියලු සචේතන ක්‍රියාවල වගකීම කර්තෘ වෙත ම පැවරූ බව.
- අත්තකාර, පරකාර, පුරිසථාම, පුරිසබල, පුරිසවීරිය, පුරිසපරක්කම ආදි ශක්තීන් උභයාර්ථ සංවර්ධනය පිණිස පුද්ගලයකු තුළ පැවතිය යුතු ධනාත්මක උත්තේජනයක් සේ දක්වන බුදුසමය සම්මා වායාම ආරම්භධාතු, නික්කමධාතු, පරක්කමධාතු, අප්පමාද, අධිට්ඨාන ආදි ආකල්ප මගින් පුද්ගල පෞරුෂය ගොඩනැගීමට උත්සාහ දරා ඇති බව.

v. බුද්ධ කාලීන සමාජයේ දියුණු වෙළඳ ආර්ථිකයක් පැවතිබවට තොරතුරු නිදසුන් මගින් පැහැදිලි කරන්න.

- වෙළඳාම දේශීය වශයෙන් මෙන් ම විදේශීය වශයෙන් ද පැවැතීම
- හුවමාරු මාධයයක් වශයෙන් මිල මුදල් භාවිතයට යොමු වීම
- වණිජ්ජා වැනි වෙළඳ ශ්‍රේණි ඇතිවීම
- භාරුකච්ච, සුප්පාරක හා තාම්‍රලිප්ත වශයෙන් ජගත් කීර්තියට පත් වෙළඳ වරායවල් ඇතිවීම
- ප්‍රසිද්ධ වෙළඳ නගර හා වෙළඳ මාර්ග ඇතිවීම

2. i බුදුරදුන්ගේ විජ්ජාචරණ ගුණයට ඇතුළත් අෂ්ට විද්‍යාවන් නම් කරන්න.

- විපස්සනා ඥාණය
- මනෝමය ඉද්ධි ඥාණය
- ඉද්ධිවිධඥාණය
- දිබ්බසෝත ඥාණය
- පරචිත්තවිජානන ඥාණය
- පුබ්බේනිවාසානුස්සති ඥාණය
- දිබ්බචක්ඛුඥාණය
- ආසවක්ඛයඥාණය

ii බහු ආගමික සමාජයක සංහිඳියාව උදාකිරීමට බුද්ධ චරිතයෙන් ගතහැකි ආදර්ශ දෙකක් නිදසුන් මගින් පහදන්න.

- කිසියම් සමාජයක විවිධ ආගමික පිරිස් හා ආගමික මතවාද පවත්නා කල යම් යම් අර්බුධකාරී තත්වයන් නිර්මාණය වන බව
- ඇතැම් අවස්තාවල එය ගැටුම්කාරී තත්වයන් දක්වා වර්ධනය වන ආකාරයක් ද දක්නට ලැබෙන බව
- විරුද්ධවාදී මත පළකිරීම. ප්‍රකෝපකාරී ක්‍රියාකාරකම්වල නිරතවීම, විරුද්ධමතවාදීන් මර්ධනය කිරීම වැනි අවස්ථාවන් ද දක්නට ලැබෙන බව
- මේ තත්වයෙන් අත්මිදීමට බුද්ද චරිතයෙන් ආදර්ශ සපයාගත හැකි බව
- බුදුරදුන් අන්‍යාගමික ආරාමවලට වැඩමකොට ඔවුන් සමග සාකච්ඡා කිරීම, අන්‍යාගාමිකයින් සමග කාරුණික හැගීමෙන් විවාදාපන්න කරුණු පැහැදිළි කරදීම, අන්‍යාගාමික ඉගැන්වීම්වලට නව අර්ථකථන සපයමින් ඒවා බුදු සමයට අදාළ කරගැනීම, අන්‍යාගාමිකයින්ගේ ප්‍රසාදයට හා ඇගයීමට හේතුවන අයුරින් ක්‍රියාකිරීම

iii සම්බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය උදෙසා ආනන්ද හිමියන්ගෙන් සිදුවූ සේවාව අගයන්න.

■ ධර්ම භාණ්ඩාගාරික තනතුර, බහුශ්‍රැත භික්ෂූන් අතර අග තනතුර, ස්මෘතිසම්පන්න භිකෂූන් අතර අග තනතුර, අවබෝධ ශක්තිය ඇති භික්ෂූන් අතර අග තනතුර හා වීර්ය සම්පන්න භික්ෂූන් අතර අග තනතුර ආනන්ද හිමියන්ට ලැබුණේ උන් වහන්සේ තුළ පැවැති විශිෂ්ට කුශලතා නිසා බව. ■ ඉතා දුෂ්කර අවස්ථාවල දී පවා බුදුරදුන් හැර නොගොස් අවශ්‍ය උපස්ථාන මැනවින් ඉටු කළ බව. ■ බුදු රජාණන් වහන්සේගේ ලෝකාර්ථ චර්යාවට නිබඳ ව ම සහය දුන් බව.

■ භික්ෂුණී සංස්ථාව ඇති කිරීමට පුරෝගාමී ව කටයුතු කළ බව. ■ සතර ඉරියව්වෙන් තොර ව වීර්ය වඩා පළමු සංගායනාවට පෙරදින රාත්‍රියේ රහත් ඵලයට පත් වූ බව. ■ පළමු සංගායනාවේ දී ධර්මයට අදාළ සියලු ගැටලු විසඳූ බව. ■ එම සංඝායනාව අවසානයේ දී මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යෑමට දීඝනිකාය ආනන්ද හිමියන් ඇතුළු පිරිසට භාර දුන් බව.

iv ආරක්ඛ සම්පදාව මූලාශ්‍රයානුසාරයෙන් පහදන්න.

- කක්කරපත්ත නම් නියම්ගම් වැසි දීඝජානු කෝලිය පුත්‍රයා බුදුරදුන්ගෙන් මෙලොව පරලොව සුව පිණිස හේතුවන ධර්මයක් දේශනා කරන්නැයි කළ ඉල්ලීමට අනුව මෙලොව දියුණුවට දේශනා කළ දහම් කරුණු හතර තුළ දෙවැන්න ආරක්ඛ සම්පදාව බව
- ''ව්‍යාසුපාදය ආරක්ෂා සම්පත්තිය යනු මෙලොව කුල පුත්‍රයෙකු විසින් උට්ඨාන වීර්යෙන් බාහු බලයෙන් දහදිය හෙළා රැස්කරන ලද දැහැමි ව උපයාගත් ධනය රජවරු පැහැර නොගනිද්ද, සොරු පැහැර නොගනිද්ද, ගිනනේ විනාස නොවෙත් ද ජලයෙන් විනාස නොවෙත් ද අයහපත් ඥාතීන් විනාස නොකරත් ද යනුවෙන් ආරක්ෂාව තහවුරු කරගෙන අවශ්‍ය කටයුතු කරයිද එය ආරක්ඛ සම්පදාවයි.''

v හොඳ නරක විනිස්චයට අදාල නිර්ණායක හතරක් ඉදිරිපත් කරන්න.

■ ලෝභ, ද්වේෂ, මෝහ, යන චේතනා මුල් කොට ගත් ක්‍රියා අකුශල කර්ම බව. ■ අලෝභ, අදෝෂ, අමෝහ, යන චේතනා මුල් කොට ගත් ක්‍රියා කුශල ක්‍රියා වන බව. ■ ධම්ම පදය යමක වග්ගයේ 'මනෝ පුබ්බංගමා ධම්මා.....' යන පළමු හා දෙවන ගාථාවලින් ක්‍රියා තීරණය කිරීමෙහි ලා චේතනාව සහ විපාකය පාදක කොට ගැනීමට උගන්වා ඇති බව. ■ 'චේතනාහං භික්ඛවේ කම්මං වදාමී....' ආදි දෙශ්නාවෙන් ද කර්ම විනිශ්චයෙහිලා චේතනාව ම පාදක කොට ගත හැකි අයුරු පැහැදිලි වන බව. ■ කාලාම සූත්‍රයේ දී ද චේතනාව හා විපාකය අනුව කුශල අකුශල කර්ම නිශ්චය කිරීමට මඟ පෙන්වා ඇති බව. ■ යම් ක්‍රියාවක් කොට පසුතැවිල්ලට පත්වෙමින් කඳුළු පිරි දෙනෙතින් විපාක විඳීමට සිදු වේ නම් එවැනි දෑ නරක ක්‍රියා වන බව. ■ යම් ක්‍රියාවක් කොට පසුතැවීමට සිදු නොවේ නම් සිනාමුසු මුහුණින් විපාක විඳීමට හැකි වේ නම් එවැනි දෑ හොඳ ක්‍රියා වන බව.

■ ඉධ තප්පති පෙච්ච තප්පති, ඉධ නන්දති පෙච්ච නන්දති ආදි ධම්ම පද දේශනාවල ද මෙලොව හා පරලොව වශයෙන් විපාකය මුල් කොට පින්-පව් තීරණය කිරීමට උගන්වා ඇති බව. ■ අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයේ දී ද තමාට හා අනුන්ට මෙන් ම දෙපක්ෂයට ම අයහපතක් වන ක්‍රියා නරක ක්‍රියා ලෙසත් යහපතක් වන ක්‍රියා හොඳ ක්‍රියා ලෙසත් පෙන්වා දී ඇති බව. ■ තමා පිළිබඳ ව ද ලෝකයා පිළිබඳ ව ද ධර්මය පිළිබඳ ව ද අධිපති කොට සිතා හොඳ නරක නිශ්චය කළ හැකි බව. ■ කැඩපතකින් තමා ම තම සිරුර නිරීක්ෂණය කරන්නා සේ තම කායික, වාචසික හා මානසික ක්‍රියා ප්‍රත්‍යවේක්ෂා කළ යුතු බව. ■ අත්තානං උපමංකත්වා ආදි වශයෙන් දැක්වෙන අත්තූපනායික ධර්මය අනුව ද හොඳ නරක නිශ්චය කළ හැකි බව. ■ රාග, ද්වේශ, මෝහ සහගත ක්‍රියා නොකළ යුතු අසාධු පාප ක්‍රියා ලෙස දක්වන කාලාම සූත්‍රය තමා විසින් ම ස්වාධීන ව සිතා බලා තීරණය කළ යුතු යයි දක්වන බව.

3\. i "මධුවා මඤ්ඤති බාලෝ ----" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කොට තේරුම ලියන්න.

මධුවා මඤ්ඤති බාලෝ - යාව පාපං න පච්චති
යදා ච පච්චතී පාපං - අථ බාලෝ දුක්ඛං නිගච්ඡති

- තේරුම : මෝඩයා තමා කළ පව් මෝරා විපාක දෙන තෙක් එය මී පැණි මෙන් (මිහිරි කොට) සලකයි. යම් විටෙක පව මෝරා විපාක දෙයි ද එවිට ඔහු දුකට පැමිණේ.

ii මංගල සූත්‍රයේ දැක්වෙන මංගල කරුණු අටක් නම් කරන්න.

■ 1. අසේවනාච බාලානං - බාලයන් ඇසුරු නොකිරීම 2. පණ්ඩිතානංච සේවනා - පණ්ඩිතයන් ඇසුරු කිරීම 3. පූජාච පූජනීයානං - පිදිය යුත්තන් පිදීම 4. පතිරූපදේස වාසෝච - සුදුසු පෙදෙසක විසීම 5. පුබ්බේච කතපුඤ්ඤතා - පෙර කළ පින් ඇති බව 6. අත්තසම්මා පණිධිච - සිත මනාසේ පිහිටුවා ගැනීම 7. බාහු සච්චංච - බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව 8. සිප්පංච - ශිල්පයෙහි දක්ෂ බව 9. විනයෝච සුසික්ඛිතෝ - තිදොර මනා ව හික්මවීම 10. සුභාසිතා ච යාවාචා - යහපත් වචන කතා කිරීම 11. මාතා උපට්ඨානං - මව පෝෂණය කිරීම 12. පිතා උපට්ඨානං - පියා පෝෂණය කිරීම 13. පුත්ත දාරස්ස සංගහෝ - අඹුදරුවන්ට සංග්‍රහ කිරීම 14. අනාකුලාච කම්මන්තා - නිරවුල් කර්මාන්ත කිරීම 15. දානංච - දන් දීම 16. ධම්ම චරියාච - ධර්මයෙහි හැසිරීම 17. ඤාතකානංච - නෑයන්ට සංග්‍රහ කිරීම18. අනවජ්ජානි කම්මානි - නිවැරදි කර්මාන්තය 19 ආරති විරති පාපා - පාපයෙන් වැළකීම 20. මජ්ජපානාච සඤ්ඤමෝ - මත්පැනින් වෙන් වීම 21. ධම්මේසු අප්පමාදෝච - ධර්මයෙහි අප්‍රමාද වීම 22. ගාරවෝච - සුදුස්සාට ගරු කිරීම 23. නිවාතෝච - යහපත් පැවතුම් ඇති බව 24. සන්තුට්ඨීච - ලද දෙයින් සතුටු වීම 25. කතඤ්ඤතා - කළගුණ දන්නා බව 26. කාලේන ධම්ම සවණං - සුදුසු කල බණ ඇසීම 27. ඛන්තීච - ඉවසීම 28. සෝච වචස්සතා - කීකරුකම 29. සමණානඤ්ච දස්සනා - ශමණයන් දැකීම 30. කාලේන ධම්ම සාකච්ඡා - සුදුසු කල බණ ඇසීම 31. තපෝච - තපස 32.බ්‍රහ්ම චරියාච - බඹසර විසීම 33. අරිය සච්චාන දස්සනං - චතුරාර්ය සත්‍යදැකීම 34. නිබ්බාණ සච්ඡි කිරියාච - නිවන් අවබෝධ කර ගැනීම 35. ඵුට්ඨස්ස ලෝක ධම්මේහි- අටලෝ දහමෙහි කම්පා නොවීම 36. අසෝකං - සෝක රහිත වීම 37.විරජං - කෙලෙස් රහිත බව 38. ඛේමං - සිත කෙලෙසුන්ගෙන් නිදහස් වීම යන මෙම කරුණු වලින් 8ක් ලියාතිබීම ප්‍රමානවත්

iii දූ කෙළියෙහි ආදීනව සූත්‍රානුසාරයෙන් දක්වන්න.

- දිනූ විට සතුරන් ඇතිවේ ■ පරාජයට පත් වූ විට ශෝක ඇතිවේ. ■ ඇස් හමුවෙහි ධනය විනාශ වේ.
■ ඔහු කියන දෙය ගණන් නොගනී ■ මිතුරන්ගේ අවමානයට ලක්වේ ■ අඹුදරුවන් පෝෂණය කිරීමට නොහැකිනිසා විවාහයට නුසුදුස්සෙක් වේ.

iv දේවානම් පියතිස්ස රජතුමාගේ ශාසනික සේවාවන් පෙන්වා දෙන්න.

- දේවානම්පියතිස්ස රජතුමා, මිහිඳු මහරහතන් වහන්සේ පිළිගෙන පළමුවෙන් ම බුදුදහම වැළඳගත් ලක් රජතුමා වූ බව
- මිහිඳු මහරහතන් වහන්සේ දැක ගැනීමට රාජ අංගණයට පැමිණි විශාල ජනකායකට ධර්ම ශ්‍රවණය සඳහා පහසුකම් සැලසූ බව
- මහා විහාර සීමා පිහිටුවා මහා විහාරය ඉදි කර බුදු සසුනට පිළිගැන්වූ බව
- අනුලා දේවිය පැවිදිවීමට කැමැත්ත දැක්වූ නිසා මිහිඳු මාහිමියන්ගේ අනුශාසකත්වය යටතේ සංඝමිත්තා මහරහත් මෙහෙණිය ශ්‍රී මහා බෝධි ශාඛාව වැඩමවාගෙන ඒමට අරිට්ඨ කුමරු ප්‍රධාන පිරිස යැවූ බව
- විනය සංගායනාවක් පවත්වා ශාසන චිරස්ථිතියට දායක වූ බව
- චේතියගිරියේ අටසැටලෙන ඉදි කර වස් විසීමට පහසුකම් සැලසූ බව
- බුදු රජාණන් වහන්සේගේ දකුණු අකු ධාතූන් වහන්සේ තැන්පත් කර ථූපාරාම ස්තූපය ඉදි කළ බව
- විහාරය, නාගදීපයේ ජම්බුකෝළෙ විහාරය, තිස්සමහා විහාරය, ප්‍රාචීනාරාමය, භික්ෂුනීන් සඳහා හත්ථාළ්හක මෙහෙණවර (අශෝකාරාමය) ආදි වෙහෙර-විහාර කරවූ බව

v මහින්දාගමනයට පෙරාතුව මෙරට යක්ෂ යක්ෂණී ඇදහිල්ලද ජනප්‍රියව පැවැති බවට නිදසුන් මගින් පහදන්න .

- කාලවේල, චිත්තරාජ, මහේජ, ජුතින්ධර, වෛශ්‍රවණ, කාලසෝදර, පශ්චිම රාජිනී, වළවාමුඛී යන යක්ෂ-යක්ෂණියන් ඇදහූ බව
- පණ්ඩුකාභය රජු කාලවේල යක්ෂයා උදෙසා නුවරින් නැගෙනහිර දිශාවේ දෙවොලක් ද චිත්තරාජ යක්ෂයා උදෙසා අභය වැවේ යටි කොනේ දෙවොලක් ද වළවාමුඛී යක්ෂණියට රජ ගෙදයන ඇතුළත ම දෙවොලක් ද කරවූ බව
- යක්ෂ - යක්ෂණියන් උදෙසා අවුරුද්දක් පාසා පණ්ඩුකාභය රජ බලිබිලි දුන් බව

## ii කොටස

4. i භාරතයේ පැවැති වික්‍රමශිලා විශ්ව විද්‍යාලයේ පාලන හා අධ්‍යාපන ක්‍රියාවලිය විමසීමට ලක්කරන්න
මිණි නයපාල රජු හා කීර්තිපාල රජු මෙහි අභිවෘද්ධියට කටයුතු කර ඇති බව ■ මනා සැලසුම් සහගත ව නිර්මිත වික්‍රමශිලාව මධ්‍යයෙහි ප්‍රධාන දේශන ශාලාව ඉදි කළ අතර එය ''විද්‍යාගෘහ'' නමින් ප්‍රචලිත ව පැවති බව ■ විද්‍යා ගෘහයට ඇතුළුවීමට දොරටු හයක් වූ අතර ඒ සෑම දොරටුවක ම සංඝාවාසයක් ඉදි කර තිබූ බව ■ විශාල තාප්පයකින් වටකොට තිබූ මුළු විශ්වවිද්‍යාලය භූමිය අලංකාර වූ අතර එක් එක් සංඝාරාමයට ''ද්වාරපණ්ඩිත'' නමින් හැඳින්වුණු පඬිවරුන් හයදෙනෙකු සිටි බව ■ වික්‍රමශිලාවේ ප්‍රවේශය ද්වාරපණ්ඩිතවරුන් විසින් පවත්වනු ලබන පරීක්ෂණයක් මඟින් සිදු වූ බව ■ ක්‍රි.ව. 983 -995 අතර කාලය තුළ පහත සඳහන් ද්වාරපණ්ඩිතවරුන් විද්‍යාමණ්ඩප භාර ව කටයුතු කර ඇති බව 1. රත්නාකර ශාන්ති - පෙරදිග දොරටුව 2. වාගීශ්වර කීර්ති - බටහිර දොරටුව 3. නරෝපා - උතුරු දොරටුව 4. ප්‍රඥාකරමති - දකුණු දොරටුව 5. රත්න වජ්‍ර - පළමු වැනි දොරටුව 6. ඥාන ශ්‍රී මිත්‍ර - දෙවැනි දොරටුව ■ වික්‍රමශලිාවෙහි අධ්‍යයන කටයුතු භාර ආචාර්යවරුන් 108 දෙනකු ද වෙනත් පරිපාලන කටයුතු සඳහා ආචාර්යවරුන් හා සම පුද්ගලයන් හයදෙනෙකු ඇතුළු 114 දෙනෙකු ද සිට ඇති බව. ■ වික්‍රමශිලා විශ්වවිද්‍යාලයයේ විෂයමාලාව, නාලන්දා විශ්වවිද්‍යාලයයේ විෂයමාලාවට සමාන බවත් ශ්‍රාවකයාන බුදුසමය, මහායාන බුදුසමය සාමාන්‍ය පරිදි ඉගැන්වීම සිදුවූ අතර තන්ත්‍රයාන බුදුසමය පිළිබඳ සුවිශේෂ ව ඉගැන්වීම් කටයුතු සිදු වූ බව ■ වික්‍රමශිලා විශ්වවිද්‍යාලයාධිපතීන් අතරින් දීපංකර, ශ්‍රී ඥාන හිමියන් හෙවත් අතීශ හිමියන් (ක්‍රි.ව. 890-1053) ඉතා කීර්තිමත් හා දෙස් විදෙස් ගෞරවාදරයට පාත්‍ර වූ ප්‍රධාන හිමිපාණන් වූ බව ■ මෙම හිමිපාණන් ටිබෙට් දේශයේ වසර 15ක් පමණ ධර්මදූත මෙහෙවරෙහි යෙදී ඇති බව ■ වික්‍රමශිලා විශ්වවිද්‍යාලයයේ කටයුතු සිදු කළ මණ්ඩල ගණනාවක් තිබූ බව 1. ආචාර්ය මණ්ඩලය 2. අධ්‍යාපන මණ්ඩලය 3. පරිපාලන මණ්ඩල 4. විනය මණ්ඩලය 5. ප්‍රවේශ මණ්ඩලය
■ මෙම විශ්වවිද්‍යාලයයේ අභිධර්ම, ව්‍යාකරණ, තන්ත්‍රයාන යන විෂයයන් සඳහා වෙන් වෙන් වූ ගොඩනැගිලි තිබූ බව
■ ජගත් කීර්තියට පත් මෙම විශ්වවිද්‍යාලය මගින් උපාධි, පශ්චාත් උපාධි පිරිනැමූ අතර දෙස් විදෙස් ශිෂ්‍යයන් අධ්‍යාපනය ලද බව ■ අටදහසක් පමණ ශිෂ්‍යයන් හා ආචාර්යවරුන් උපාධි උත්සවයට ප්‍රධාන ශාලාවට රැස් ව සිටි බව හියුංසියැංගේ වාර්තාවල සඳහන් වන බව ■ ක්‍රි.ව. 800 පමණ සිට කීර්තිමත් වූ හා ජගත් ගෞරවාදරයට පත් මෙම විශ්විවිද්‍යාලයය 12 වැනි සියවසේ නාලන්දා විශ්වවිද්‍යාලයය විනාශ කළ මුස්ලිම් ආක්‍රමණිකයන් ද විනාශ කළ බව

ii සම්බුද්ධ ශාසනයේ උන්නතිය උදෙසා කණිෂ්ක අධිරාජයාණන්ගෙන් සිදු වූ මෙහෙය අගයන්න.
■ කණිෂ්ක රජු විසින් අඩි 500ක් උසට විශාල චෛත්‍යයක් ගොඩනගා සර්වඥ ධාතූනිදන් කළ අතර එහි අටනැළියක පමණ ධාතු ඇතුළත් යැයි සැලකෙන බව. ■ කණිෂ්ක රාජ්‍ය සමයේ භාවිත වූ කාසිවල බුදු රුව දැකිය හැකි බව ■ පුරුෂ පුරය තම රාජධානිය කරගත් රජු එහි විශාල ආරාමයක් ඉදි කළ බවත් එතුමාගේ අභාවයෙන් පසු ද දීර්ඝ කාලයක් එය සක්‍රිය දායකත්වයක් දැක්වූ බව ■ මෙතුමාගේ රාජ්‍ය සභාවේ වසුමිත්‍ර පාර්ශ්ව නාගාර්ජුන, අශ්වඝෝෂ වැනි බෞද්ධ මහා පඬිවරු වාසය කළ බව ■ බුද්ධ ශාසනය තුළ විවිධ විෂමතා දැනගත් රජු කුණ්ඩල වන විහාරයේ දී පාර්ශ්ව තෙරණුවන්ගේ ප්‍රධානත්වයෙන් සිවු වන ධර්ම සංඝායනාව පැවැත්වීමට අනුග්‍රහය දැක්වූ බව ■ සංගායනාව අවසානයේ දී සාකච්ඡා කළ විභාෂා හා සූත්‍ර ඇතුළත් කර උපදේශ ශාස්ත්‍ර, විනය විභාෂා ශාස්ත්‍ර නමින් ග්‍රන්ථ දෙකක් සම්පාදනය කළ බව ■ එම කෘති තඹපත්වල ලියා ශෛලමය මංජුසාවක බහා නිධන් කොට මහා සෑයක් ඉදිකළ බව ■ එම චෛත්‍ය වර්තමානයේ ද කාශ්මීරයේ පවතින බව ■ සිවුවන ධර්ම සංගායනාවෙන් පසු රජුගේ අනුග්‍රහයෙන් මධ්‍ය ආසියාවේ ධර්ම ප්‍රචාරක සේවාවක් ආරම්භ කළ බව ■ සිවුවන ධර්ම සංගායනාව සර්වාස්තිවාදී සංගීතියක් ලෙස ප්‍රසිද්ධියට පත් ව ඇති බව

5. i ජනතාවාදී රාජ්‍ය පාලනයක් බිහිකරගැනීමෙහිලා බෞද්ධ දේශපාලන ඉගැන්වීම්වල පවත්නා සර්වකාලීන වැදගත්කම ගෙනහැර දක්වන්න.

- දසරාජ ධර්ම, දස සක්විතිවත්, පංච සීල ප්‍රතිපදාව, සතර සංග්‍රහ වස්තු, සප්ත අපරිහානීය ධර්ම, සතර අගති විරතිය යන කරුණු වල පවත්නා සර්වකාලීන වැදගත්කම ඉදිරිපත් කරමින් දේශපාලණික කටයුතු සඳහා ඒවා ඉවහල් කරගැනීමෙන් ඇතිවන සුන්දර දේශපාලන පරිසරය ගැන විස්තර වී තිබිය යුතුය.

ii සෞන්දර්ය රසවිඳීම පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පුද්ගලයාගේ ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා උපයෝගී කරගත හැකි ආකාරය විමර්ශනය කරන්න.

- මිනිසාට සුවදායක වූත් ප්‍රීති ජනක වූත් ජීවිතයක් ගත කිරීමට බුදු සමය නිරතුරුව අනුබල දෙයි. එබැවින් ප්‍රබුද්ධ රුචිකත්වයක් ඇතිපුද්ගලයෙකු බිහිවීමට බුදු සමයෙන් බාදාවක් නැත.
- නතේ කාමායානි චිත්‍රානි ලෝකේ යන බුදු වදනට අනුව ලොව විචිත්‍රදේ කාමයෝ නොවන බවත් පුද්ගලයෙකු තුල පවතින රාග සංකල්පය කාමය වන බවත් නුවණැත්තන් කාමයෙන් තොරව සෞන්දර්ය ආශ්වාදනය කරන බවත් මෙකී ආකල්පයෙන් වීතරාගී රහත් උතුමන් අපාදානයෙන් තොරව සුන්දරත්වය අත්විදින බව විස්තර විය යුතුය.
- බුදු සමය සෞන්දර්යාස්වාදය යනුවෙන් පිළිගනු ලබන්නේ සංවේදිත්වය හා බුද්ධිය සංකලනය වූ ආකල්පයකින් යමක් වින්දනය කිරීමය. වීතරාගී උතුමන් සෞන්දර්ය දුටුවේ මෙවැනි ආකල්පයෙනි.
- බෞද්ධ චින්තනයට අනුව පුද්ගලයාගේ චරියභාවමය වහයෙන් හා බුද්ධිමය වශයෙන් සංවර්ධනය විය යුතුය. නැතහොත් ශ්‍රද්ධාවෙන් හා ප්‍රඥාවෙන් පෝෂණය විය යුතුය. භාවමය සංවර්ධනය යනු සංවේදනාත්මක අංශයේ සංවර්ධනයයි. ශ්‍රද්ධාව. මෛත්‍රිය. දයාව කරුණාව අනුකම්පාව, මෘදුබව. ආදරය සොම්නස යනාදී මානව ගුණාංග විකසිත වන්නේ පුද්ගලයාගේ සංවේදනාත්මක අංශය සංවර්ධනය වීමෙනි.
- මලක සුන්දරත්වය දකින ප්‍රබුද්ධයා එහි වර්ණය ද සුගන්ධයද විඳගනී. ඒ භාවමය දියුණුව තුලිනි. එසේම හෙතෙම මල මැලවෙන වැනසෙන ධර්මයක් බව ද දනී.ඒ යථාවබොධයෙනි.

6. i ශාසන චිරස්ථිතිය විෂයෙහි භාරතයේ පැවැති ථෙරවාදී සංගායනාවලින් සිදු වූ මෙහෙය ප්‍රමාණ කරන්න.

- විනය ශාසනයේ ආයුෂය ලෙස පිළිගෙන කටයුතු කිරීමට පෙළඹීම
- ධර්ම විනය ඒකරාශී කොට භානක පිරිස් මගින් ඉදිරියට පවත්වාගෙන යාමට කටයුතු සංවිධානය කිරීම
- නොපැනවූ නිති නොපැනවීමටත් පැනවූ නීති කඩනොකට ක්‍රියත්මක කිරීමට එකගතාවක් ඇති කරගැනීම
- වජ්ජිපුත්තක භික්ෂූන් විසින් ඉදිරිපත්කරන ලද දසවස්තුව සබ්බකාමී මහරහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රැස්වූ සංඝ සම්මේලනයේදී ධර්ම විනය විරෝධී අකැප වස්තුවක් සේ එකිනෙක විශ්ලේෂණය කොට ප්‍රතික්ෂේප කිරීම
- දසවස්තුවක් ප්‍රතික්ෂේප වීමත් සමග ශාසන චිස්ථිතිය සඳහා එය ඉවහල්වීම
- වසර සියයක් මුළුල්ලේ අවිඡින්නව පැවති ථෙරීය භික්ෂු පරම්පරාව ථෙරවාද හා මහා සාංඝික වශයෙන් දෙකොටසකට බෙදී මින් ඉදිරියට ක්‍රියාත්මක වීමට යොමුවීම .
- දුසිල් භික්ෂූන් හෙවත් ශ්‍රමණ වේශධාරීන් සසුනෙන් නෙරපා භේද භින්නව සිටි භීක්ෂූන් සමගි කරවා ශාසන සංශෝෂය කිරීම
- නැවැතී තිබූ විනය කර්ම නැවැත ආරම්භ කිරීම
- බුදු දහමට එකතුවී තිබූ පරවාද 500ක් බණ්ඩනය කරමින් සකවාද 500ක් තහවුරු කරමින් කථාවත්ථුප්පකරණය රචනා කිරීම
- මෙය රචනාවීමත් සමග අභිධර්ම පිටකය ප්‍රකරණ ග්‍රන්ථ 7කින් යුක්තව සම්පූර්ණ වීම
- භාරතයේ විවිධ ප්‍රදේශ සහ විදේශීය රටවල් කිහිපයකටම භික්ෂූන් පිටත් කර යවා බුද්ධ ධර්මය ව්‍යාප්ත කිරීම
-

ii මහාවිහාරීය භික්ෂූන් වහන්සේලාගෙන් ඉටු වූ ආගමික හා ජාතික මෙහෙවර අගයන්න.

ආගමික මෙහෙවර

- ලාංකේය ථෙරවාද බුදුසමයේ කේන්ද්‍රස්ථානය බවට මහාවිහාරය පත්වීම
- ලාංකේය ථෙරවාද බුදුසමයේ කේන්ද්‍රස්ථානය බවට මහාවිහාරය පත්වීම
- මහා අරිට්ඨ තෙරුන් වහන්සේ ඇතුළු මහ තෙරවරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූ විනය සංගායනාව මහා විහාරය ආශ්‍රිතව සිදු කිරීම
- පාලි ත්‍රිපිටකයට සිංහල අට්ඨකතා මහා විහරයෙන් සැපයීම
- වලගම්බා හා මහසෙන් රාජ්‍ය වකවනුවලදීත් ඉන්පසුවත් ඇතැම් පාලකයන්ගේ කාල වකවානුවලදී ථෙරවාද බුදු සමයට අභියෝග එල්ල වූ අවස්ථාවන්හිදී ථෙරවාද බුදුසමය ආරක්ෂා කිරීමට දිවිහිමියෙන් කැපවීම
- මාතලේ අලුවිහාරයේදී ත්‍රීපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට යොමුවීම
- බුද්ධඝෝස, බුද්ධ දත්ත හිමි, ධම්මපාල හිමි, පීතිමල්ල හිමි. විශාඛ හිමි වැනි ජාත්‍යන්තර පඬිවරුන් මහා විහාරය ඇසුරෙන් ථෙරවාද බුදු දහම හැදෑරීම

* කපාර පිරිවෙණ, කාල ප්‍රසාද පිරිවෙණ, සුන්හාත පිරිවෙණ, දික්සඳ සෙනවියා පිරිවෙන, ආදී ලක්දිව සිව් දිසාවේම මුල්කාලීනව බිහිවූ පිරිවෙණ මගින් ථෙරවාද බුදු දහම ප්‍රචලිත කිරීමට කටයුතු කිරීම
* දේශීය වශයෙන් පමනක් නොව පර්සියාව, ග්‍රීසිය, බුරුමය, චීනය වැනි රටවලින් ද ඉන්දියාවේ විවිධ ප්‍රදේශවලින්ද පැමිණි භික්ෂූන් වහන්සේලාට සිල්ප හැදෑරීම ට අවස්ථාව ලබාදීම
* නා නා නිකායික මති මතාන්තර ඛණ්ඩනය කොට ථෙරවාදය සුරක්ෂිත කරගැනීමට කටයුතු කිරීම

ජාතික මෙහෙවර

* අනුශාසනා මගින් සමස්ත ජාතියේම අධ්‍යාමික වූත් බාහාර වූත් සංවර්ධනයට අදාළ උපදේශය ලබා දෙන නායකයන් ලෙස කටයුතු කිරීම.
* මහාවිහාරය හා තදානුබද්ධ විහාර ජාතියේ අධ්‍යාපන මධ්‍යස්ථාන ලෙස පවත්වාගෙන යාම. මෙහි දී ආධ්‍යාමික ශික්‍ෂණයට සමගාමීව ලෞකික දියුණුවට අදාළ විෂයයන් ද ජීවන දර්ශනය ද ඉගැන්වීම.
* මහා විහාරීය භික්ෂූන් පාලකයාගේ අනුශාසකයන් ලෙස කටයුතු කිරීමත්, ඇතැම් පාලකයන් තෝරා ගැනීමේ දීත්, ඇතැම් අධාර්මික පාලකයන් පලවා හැරීමේ දී ප්‍රමුඛ කාර්යය භාරයක් ඉටු කිරීම.
* අනාගත රාජ්‍යත්වය සඳහා පාලකයන් පුහුණු කොට රැක ගැනීම.
* ජාතික ව්‍යසනයන්හි දී ඉන් මිදීම සඳහා නායකත්වය හා නිසි උපදෙස් ලබා දීම.
* බුද්ධ දේශිත ශ්‍රී සද්ධර්මය මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන රැක ගනිමින් ද ග්‍රන්ථාරූඪ කිරීමෙන් ද අටුවා ග්‍රන්ථ හා වෙනත් විවිධ ග්‍රන්ථ රචනා කිරීමෙන් ද දේශිය ආගමික සංස්කෘතික අනන්‍යතාව සුරක්ෂිත කිරීමෙහි ලා ප්‍රමුඛත්වය ගැනීම.
* වෙදකම, ජ්‍යොතිෂය, ශාන්ති කර්ම වැනි පොදුජන ජීවිතයට ඍජු ව බද්ධ වූ සේවාවන් හි විශේෂඥයන් බවට පත් ව එමගින් ජාතික මෙහෙවරක් ඉටු කිරීම.

i ශ්‍රමය මෙන්ම ශ්‍රමිකයා ද ඇගයීමට ලක්ව ඇති අයුරු පිරික්ෂන්න.

* සිගාලෝවාද, ව්‍යග්ගපජ්ජ, පත්තකම්ම, අණන ආදී වශයෙන් සූත්‍ර ගණනාවක ශ්‍රමය ඇගයීමට ලක්කර ඇති අතර අංගත්තර නිකායේ කුසීතාරම්භ වස්තු සූත්‍රයේ දීද ශ්‍රමයේ වැදගත්කම අවධාරනය කර ඇති අයුරු විස්තර විය යුතුය.
* සිගාලෝවාද සූත්‍රයෙහි ස්වාමියාගෙන් සේවකයාට ඉටු ඉටුවිය යුතුකම් ලෙස දක්වා ඇති කාරනා පහතුළින් ශ්‍රමිකයා ඇගයීමට ලක්වී ඇති අයුරු පැහැදිළි විය යුතුයි.

ii ථායිලන්ත ජන සංස්කෘතිය බුදු දහමින් පෝෂණය වී ඇති ආකාරය පරීක්‍ෂා කරන්න.

■ බුදුදහම නඩත්තු කිරීම, ආරක්ෂා කිරීම රාජ්‍ය යුතුකමක් ලෙස සැලකෙන අතර රජයේ ප්‍රධානයා බෞද්ධයකු විය යුතු බව. ■ බෞද්ධ විහාරාරාම පාලනය කිරීම, රජයේ පාලනයට යටත් වන අතර විහාරස්ථානවල ආගමික කටයුතු සඳහා අවශ්‍ය සියලු වියදම් රජය විසින් දරන බව ■ ක්‍රමවත් සංඝ සංවිධානයක් පවතින අතර එහි ප්‍රධානයා රජය විසින් පත් කරන ලද සංඝ රාජයන් වහන්සේ නමක් වන බව ■ තායි පිරිමින් ටික කලකට හෝ පැවිදි වී සිටීම චිරාගත සම්ප්‍රදායයක් වන අතර පැවිදි වීම හා උපැවිදි වීම උත්වශ්‍රීයෙන් සිදුවන බව ද, එම තාවකාලික පැවිද්දේ දී හමුවන සහතිකය විවාහ වීමේ දී හා රැකියා ලැබීමේ දී විශේෂ සුදුසුකමක් සේ සලකන බව ද සඳහන් වන බව ■ මනා ගිහිපැවිදි සම්බන්ධතාවක් පවතින අතර තායි භික්ෂූන් වහන්සේගේ ශිෂ්‍යයන් තුළ ආධ්‍යාත්මික අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරන අතර ම ලෞකික ජීවිත ගැටලුවලට ද විසඳුම් සැපයීම සිදු කරන බව ■ තායි ජනතාව දෛනික ව ආගමික කටයුතුවල නිරත වීමට අවශ්‍ය පූජාසනයක් කාමරයක සකස් කරගෙන එම පූජා කටයුතුවල නිරත වන බව ■ තායි රටේ ලොකු කුඩා සැම අයෙකුගේ ම ගෙලෙහි බුද්ධ රූපයක් පැළඳගෙන සිටීම සුලබ දසුනක් වන අතර එය සකස් කරනු ලබන්නේ භික්ෂූන් වහන්සේ විසින් බව ■ තායි විහාරස්ථානවල පැවිදි පිරිස් මෙන් ම බහුල ව ළමයින් ද වාසය කරන බව ■ වාර්ෂික ව පැවැත්වෙන උත්සව අතර වෙසක් උත්සවය හා කඨින පූජෝත්සවය ප්‍රමුඛ තැනක් ගන්නා බවත් කඨින චීවරය ගෙන යන පෙරහැර ජාතික ක්‍රීඩාවලින් සමන්විත වන බවත් තායි රජතුමා කිසියම් විහාරයක කඨින පින්කමට සහභාගි වීම අනවාර්ය බවත් දැක්වෙන බව

■ අධ්‍යාපනය කලා ශිල්ප හා සාහිත්‍යය ද බුදු දහමින් පෝෂණය වී සංස්කෘතිය පෝෂණය කරලීමට දායකත්වයක් ලබා දී ඇති බව

8. I ලාංකේය බෞද්ධ ගීත සාහිත්‍යය කෙරෙහි මෙන්ම ජනකවිය කෙරෙහි ද බුදු දහමේ ආභාෂය ලැබී ඇති අයුරු නිදසුන් මගින් පැහැදිළි කරන්න.

ii මෙරට ජන කවියට මෙන්ම ගීත සාහිත්‍යය කෙරෙහිද බුදුදහමේ ආභාසය ලැබී ඇති අයුරු නිදසුන් මගින් පැහැදිලි කරන්න.

* අපේ පැරණි සමාජය පන්සල ඇසුරෙන් හොඳ නරක කුෂල් අකසල් පින් පව් හැඳින තම දෛණික ජීවන වෘත්තීන්හි නිරත වූ බව
* එම ජීවන වෘත්තීන්හිදී කාංසිය මහන්සිය දුක ශෝකය පීඩාව මගහරවා ගැනීමට ජනකවිය උපයෝගී කරගෙන ඇත.
* එම ජනකවියට බුදු දහම මූල බීජ වූ අවස්ථා පැල්කවි පතල් කවි පාරුකවි ගැල් කවී ආදිය පිළිබඳව විමසා බැලීමෙන් පැහැදිළි වේ.

- බොන්නේ බොර දියයි පූරුවෙ කළ පවට, පව් කළ ගොනෝ ඇදපන් හපුතල් යනවා, බුදුන් වඳින ලෙස වැඳපන් අම්මාට, නිවන් පුරේ පලයන් තලගොයි පැටියා, සාදුකාර දී ඔරුවක නැඟී වරෙන් යනුවෙන් සඳහන් ජනකවි මඟිනුත් තුන් සරණේ කවි මඟිනුත් බෞද්ධ ආභාසය පිළිබිඹු කෙරෙන බව
- තෙරුවන් පිළිබඳව ශ්‍රද්ධාව ජනනය කිරීමත් බුද්ධ චරිතය පිළිඹු කිරීමත් බෞද්ධ දර්ශනය ප්‍රකට කරලීමත්, ශාසන ඉතිහාසය, ඉදිරිපත් කිරීමත් අරමුණු කරගෙන මෙරට බෞද්ධ ගීත සාහිත්‍යය ගොඩනැඟී ඇති බව

- ගීත සාහිත්‍යය කෙරෙහිද බුදුදහමේ ආභාසය ලැබී ඇති බවට අතීත මෙන්ම වර්තමාන ගීත සාහිත්‍ය නිදසුන් සපයයි.
- අමාදහර දිය ගලා ගලා, බුද්ධං සරණං ගච්ඡාමි, සුගත ලෝනා සම්බුද්ධ රාජා. දන්නෝ බුදුන්ගේ ශ්‍රී ධර්මස්කන්ධ, අඩවන් වූ දෙනෙතින් ගලනා, දස බිම්බර මාර සෙනඟ, පාරමිතාබල පූරිත පූජිත, සන්නාලියනේ, සංසාරේ බවේ දුකා, අඩු කුලේ කියාලා, කවාලා විළඳ ජාති, සොර දෙටුවෙක් කස තැළුම් කකා..... ආදී වශයෙන් ඇති ගීත නිදසුන් වශයෙන් දැක්විය හැකි බව.

ii බෞද්ධ ස්තූපයේ ප්‍රභවය දක්වා එහි පවත්නා ආගමික හා සංස්කෘතික වටිනාකම විමර්ශනය කරන්න.

- ස්තූපය බෞද්ධයන්ගේ ප්‍රධානතම සංකේතයක් වන අතර එහි ආරම්භය බුද්ධකාලය තෙක් ඈතට දිවයන යන බව ත්‍රිපිටාකගත මූලාශ්‍රයන්ගෙන් මෙන්ම වංශකතා සාහිත්‍යයන්ගෙන් ද තොරතුරු හෙළිවන බව
- සැරියුත් මුගලන් අගසව් දෙනම මෙන්ම මහාප්‍රජාපතීගෝතමී ආදී ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ ධාතුතැන්පත්කොට බුදුරදුන් ස්තූප ඉදිකිරීමට බුදුරදුන් උපදෙස් ලබාදුන් බව වාර්ථාවේ.
- බුදුරදුන්ගෙන් දහම් අසා රහත්ඵලයට පත් බාහිය දාරුචිරිය එළදෙනෙක විසින් ඇන මරණයට පත්කරනු ලැබීමෙන් අනතුරුව එම දේහය ඇඳක තබාගෙන ගොස් දවා ස්තූපයක් කරවන ලෙසට බුදුරදුන් උපදෙස් ලබා දුන් සඳහන් වේ.
- "චත්තාරෝ මේ ආනන්ද ථූපාරහා, කතමේ චත්තාරෝ ? තථාගතෝ අරහං සම්මා සම්බුද්ධො ථූපාරහෝති. පච්චේක බුද්ධෝ ථූපාරහෝ තථාගතස්ස සාවකෝ ථූපාරහෝ රාජා චක්කවත්ති ථූපාරහෝති."යනුවෙන් ථූපාර්ය පුද්ලයන් පිළිබඳව මහාපරිනිබ්බාණ සූත්‍රයේ කරනු ලබන සඳහන තුළින්ද බෞද්ධ ස්තූපය පිළිබඳ සංකල්පය බුදුරදුන් විසින්ම ඉදිරිපත් කරන ලද්දක් බව පැහැදිළිවේ.
- බුදුරදුන් පිරිනිවන් පෑමට පෙර තථාගත දේහයට කෙසේ අවසන් ගෞරව දැක්විය යුතුදැයි ආනන්ද තෙරුන් බුදුරදුන්ගෙන් විමසූවිට සක්විති රජකුගේ මෘතදේහයට අවසන් ගෞරව දක්වන ආකාරයට දේහය ආදාහනය කොට සිව්මන්සලක ස්තූපයක් ඉදිකර ප්‍රදක්ෂිණා කිරීමෙන්, මල්දම් පැලදවීමෙන්, සුවඳ හෝ සුනු ගැල්වීමෙන් එයට පූජා පැවත්වීමට උපදෙස් ලබාදීම තුළින්ද බෞද්ධ ස්තූපයේ ප්‍රභවය බුද්ධකාලය දක්වා ඈතට දිවයන බව පැහැදිළිය.
- බුද්ධ පරිනිර්වානයෙන් පසු ආදාහන කටයුතුවලට සම්බන්ධ ප්‍රදේශ අටක නියෝජිතයින්ට බුදුරදුන්ගේ ධාතු බෙදාදීමෙන් පසු ඔවුහු එම ධාතු නිදන්කොට ස්තූප තැනවූ බව වාර්ථාවේ.
- පුරාවිද්‍යාත්මක සාධකවලට අනුව ස්තූපයේ ආරම්භය ක්‍රි. පූ. තුන්වන සියවස දක්වා ඔබ්බට නොයන අතර අශෝක අධිරාජයා කළ සාංචි, භාර්හුට් ස්තූප තුළින් හෙළිවන බව
- ත්‍රිවිධ චෛත්‍යයන් අතර ශාරීරික චෛත්‍යයක් වශයෙන් ස්තූපය ආගමික වශයෙන් වැදගත්වීම
- ස්තූපාංග තුළින් ආගමික දර්ශනයක් ප්‍රකාශවන බව හුවා දක්වීම
- ස්තූපයට ජීවමාන බුදුරදුන්ට මෙන් පොදුවේ උපහාර දක්වීමට යොමුවීම
- සංස්කෘතික වශයෙන් කලාත්මක ගෘහ නිර්මාණ අංශයක් වශයෙන් එහි වැදගත්කම පෙන්නුම් කළ යුතු ය.
- ස්තූපය මුල්කරගෙන අතීතයේ සිට වර්ථමානය දක්වා විවිධ පුද පූජා චාරිත්‍ර ගොඩ නැගෙමින් පැවැතීම
- ස්තූපය පදනම්කරගෙන චිත්‍ර, මූර්ථි, කැටයම්, නිර්මාණය වීම
- ස්තූපය පදනම් කරගෙන සාහිත්‍ය නිර්මාණය වීම